# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීම් වාර්තාව.
# 2019.04.11

වර්ෂ 2019 ක් වූ අප්‍රේල් මස 11 වැනි බ්‍රහස්පතින්දා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ අප්‍රේල් මස මහා සභා රැස්වීම් වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රිනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**නොපැමිණි**

01. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

( ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා, ගරු මන්ත්‍රිනී ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය, ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය, ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අද තියෙන්නේ අප්‍රේල් මාසයට අදාළ මහා සභා රැස්වීම. ගොඩක් මන්ත්‍රීවරු කාර්යය බහුලයි අද දිනයේ. න්‍යායපත්‍රානුකූලව අද සභාව කරලා ඉතා ඉක්මනින් අවසන් කරන්න මම බලාපොරොත්තු වෙනවා. මන්ත්‍රීවරු කීපදෙනෙක්ම මගෙන් ඉල්ලීම් කරා අද සභාව කලින් ඉවර කරන්න කියලා. ඒක හින්දා න්‍යායපත්‍රානුකූලව ගිහින් අවශ්‍ය කටයුතු විතරක් සාකච්ඡා කරලා අද සභාව වේලාසනින් ඉවර කරන්න අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**1) 2019.03.19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019.03.19 දින පැවති මහා සභා වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න නැත්නම් 2019.03.19 දින පැවති මහා සභා වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අවසරයි ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අපි සභාව පිහිටුවලා අවුරුද්දක් ගෙවිලා තියෙනවා. ආපස්සට හැරිලා බලනකොට අර අසිත තවුසාට වගේ තමයි තියෙන්නේ. හිනාවෙලා අඬන්න වෙනවා. අපි අඬන්නේ නැතුව දිගටම හිනාවෙලා ඉමු. ඒ කාලසීමාව ඇතුළතදී කාට හෝ මගේ අතින් පෞද්ගලිකව හෝ අපේ පක්ෂයේ කණ්ඩායමෙන් නොසිතා හරි අඩුපාඩුවක් හෝ වැරැද්දක් සිදුවුනා නම් සමාවෙන්න. සභාවේ අඩුපාඩුකම් අපි පෙන්වා දුන්නා නම් පෙන්වා දුන්නේ සද්භාවයෙන්. මේ සභාව ඉදිරියට යන්න ඕන කියන මතයේ ඉඳගෙන. මේ අවස්ථාවේදී මම උපයෝගි කරගන්නවා සුභ පතන්න මන්ත්‍රී මණ්ඩලයේ සහ කාර්ය මණ්ඩලයේ සියලු දෙනා ඇතුළු බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ සියලුම ජනතාවට වාසනාවන්ත සුභ අලුත් අවුරුද්දක් ලැබෙන්න කියලා.

සභාපතිතුමනි, මම අවධානය යොමු කරනවා විසිහය වන පිටුව වෙත.

26 පිටුව

"ඊළඟට එකක් තියෙනවා සභාපතිතුමා. මේ ටික තේරුම් ගන්න ඕන නිසයි කියන්නේ. බොහොම පැහැදිලිව ප්‍රාදේශීය ලේකම් එකෙන් ඉල්ලන කොට නීතිපති දෙපාර්තමේන්තුවෙන් එවනවා ලියුමක්. ඒක නීතිපති නෙමෙයි එවුවේ. ගාල්ල උසාවියෙත් නීතිඥයෝ ඉන්නවා. ඒ අය ලියලා යවනවා ලියුමක් මේක බාධාවක් නෙමෙයි කියලා." මේ සම්පූර්ණයෙන්ම වැරදි අර්ථකථනයක් ලබා දෙන්නේ. මේක සම්පූර්ණයෙන්ම වැරදි දෙයක්. මම කිවුවේ නෑ ගාල්ලේ නීතිඥයෝ කියලා. මම කියපු දේ තේරුම් ගත්තද දන්නේ නෑ. මේක ඉතාම පැහැදිලිව නිවැරදි වෙන්න ඕන. මම කිවුවේ දැන් ගාල්ල උසාවියට ගිහින් තමුන්නාන්සෙලා මොකක් හරි ප්‍රශ්නයක් කිවුවම නීතිඥයෝ එවනවා ලෙටර් ඩිමාන්ඩ් එකක් එක්ක වගේ. ඒ වගේ නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිකං නීතිඥයෝ එවනවා. නීතිපති නෙමෙයි එවන්නේ. ඒක තමයි මම කිවුවේ බොහොම පැහැදිලිවම. ඒක සංශෝධනය විය යුතුයි.

28 පිටුව

"එතනදී බොහොම පැහැදිලිව කිවුවා ඉස්සරහ කොටස ගන්නේ නෑ කියලා." ඒක "එතනදී බොහොම පැහැදිලිව කිවුවා ඉස්සරහ කොටස වෙන්දේසි කරන්නේ නෑ කියලා." ලෙස සංශෝධනය විය යුතුයි.

මම හිතන්නේ ඒක ගරු සභාපතිතුමාට මතක ඇති. අපි සියලු දෙනාම හිටියේ ඒ මතයේ. ඒ කොටස වන වගාවක් සඳහා යොදවන්න කියලා. පාර හදන්න පමණක් ඒ කොටස භාවිතා කරන්නේ කියලා කිවුවේ. එදා අපි එතනින් පිටත්වුනේ ඒ මතයේ. එතන පළාත් සභා මන්ත්‍රීවරු හිටියා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුත් හිටියා. එහෙම තමයි එදා එන්.බී.ආර්.ඕ එකෙන් ආපු නිලධාරියා කිවුවේ.

එම පිටුවෙම රොස්වුඩ් වෙන්දේසි ඉඩම සම්බන්ධව ඇති ගැටලුවේදී "ඊළඟට එතනට පරිසර වාර්තාවක් අවශ්‍ය වෙන්නේ නැත්නම් කොතනටද පරිසර වාර්තාවක් අවශ්‍ය වෙන්නේ කියලා හිතෙනවා." ඒක "ඊළඟට එතනට පරිසර වාර්තාවක් අවශ්‍ය වෙන්නේ නැත්නම් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ කොතනටද පරිසර වාර්තාවක් අවශ්‍ය වෙන්නේ කියලා හිතෙනවා." ලෙස සංශෝධනය විය යුතුයි.

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තියෙන රොස්වුඩ් කියන ඒ වෙන්දේසි කරපු ඉඩමට පරිසර බලපත්‍රයක් අවශ්‍ය වෙන්නේ නැත්නම් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ කොතනටවත් පරිසර වාර්තාවක් අවශ්‍ය වෙන්නේ නෑ. ඒ වෙන්දේසි ඉඩමට පරිසර බලපත්‍රයක් පැහැදිලිවම තියෙන්න ඕන.

30 පිටුව

" අවසතු කරේ කුලරත්න නම්." ඒක "අවසතු කරේ කුලරත්නට නම්." ලෙස සංශෝධනය විය යුතුයි.

35 පිටුව

කාරක සභා වලට අපේ විරෝධයක් නැත්තේ නෑ. විරෝධයක් තියෙනවා බොහොම පැහැදිලිවම. අද දවසේ විශේෂයෙන් මතක් කරන්න ඕන අපි මේ කමිටුවලට සහභාගී වෙන්නේ නෑ. ඒක නිසා අපි මේකේ වගකීමක් නොදැරිය යුතුයි. අපේ පක්ෂයේ අය බොහොම පැහැදිලිව තීන්දු කරා. අපි කමිටුවලට පක්ෂපාතීත්වයක් නෑ. ඒක ඔබතුමන්ලාට තියෙනවා. ඒක සම්මත කරගෙන යන්න පුලුවන්. ඒකයි එන්න ඕන අදහස. ඒ කියන්නේ අපි විරුද්ධයි බොහොම පැහැදිලිවම. බෙදීමකට ගියා හෝ නොගියා මින් ඉදිරියටත් ඒක එහෙමයි.

36 පිටුව

" ටෙලිෆෝන් ටවර්" ලෙස සඳහන් සියලු ස්ථාන " විදුලි සංදේශ කුළුණු" ලෙස සංශෝධනය විය යුතුයි.

40 පිටුව

වෙන්දේසි ඉඩම්වල අවුරුදු පහක නඩත්තුව පිළිබඳ කතාව තියෙන්නේ. මම පැහැදිලිවම කිව්වේ වෙන දෙයක් නෙමෙයි. අපි දිගින් දිගටම මේ පැතුම් උයනේ දාපු බෝක්කුවේ තියෙන වැරැද්ද පිළිබඳ බොහොම පැහැදිලිව තේරුම් කරලා දුන්නා. ඒ තේරුම් කරලා තියෙද්දිත් ඒ ටික කෙරුණේ නෑ. ඒ සිලින්ඩර් කැඩිලා යන්න මාස තුනක් හතරක් ගියේ නෑ. අපි කිව්වේ එතනට පෙට්ටි කාණුවක් දාන්න ඕන කියලා. දාන්න ඕන ඒකයි. ඒක ලොකු අඩුපාඩුවක්. මේක පැහැදිලි කරා.

ඊලඟට ඊරියගහදූව පාරේ අද වෙනකොට යන්න බෑ. මුළු පාරෙම ඒ දාපු ලැලිත් කැඩිලා ගිහිල්ලා. පාරත් කැඩිලා ගිහිල්ලා. ඒ බෝක්කුවට දාපු ස්ලැබ් කැලිත් කැඩිලා ගිහිල්ලා. ඒකයි කිව්වේ. ස්තුතියි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා පොඩි පැහැදිලි කිරීමක් කරන්න තියෙනවා. උත්සව අත්තිකාරම් ලබා ගැනීම සඳහා මන්ත්‍රීවරු ලියුමක් ඉදිරිපත් කරපු වෙලාවේ මම ඇහුවා ඊයේ පෙරේදා බඳවා ගනිපු දෛනික වැටුප් ලබන කම්කරුවන්ට උත්සව අත්තිකාරම් ලබා දෙන්නේ නැද්ද කියලා. ඒ වෙලාවේ කාරක සභාවක් යෝජනා කරා ලේකම්තුමාට කතා කරන්න. මම ඒක දුර දිග ගෙනියන්නේ නෑ. ඒකට ගොඩක් විස්තර මට කියන්න පුළුවන්. ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛ ගැන කියලා තමයි මම ඒ වෙලාවේ කතා කරේ. මට තියෙන ගැටලුව මේ සභා වාර්තාවේ තියෙනවා හැටහත් වතාවක් සභාව පැහැදිලි නොවීය කියලා. මේ නිසා අත්‍යාවශ්‍ය කරුණු මග ඇරෙන්න පුළුවන්. හිතාමතාම උනත් මේක දාලා මග අරින්න පුලුවන්. මේක බරපතල සිද්ධියක්. මේක වෙන්න බෑ. සභාව පැහැදිලි නොවෙන්න දුර දිග යන දේවල් මෙතන වෙන්නේ නෑ. හිතාමතාම වැදගත් කාරණා මග අරින්න පුළුවන්. ඡේදයක් ඇතුලත් කරන කොට අයින් කරන්න පුළුවන්. ඔබතුමා ගණනය කරලා බලන්න මේ සභාවේ හැටහත් තැනක තියෙනවා සභාව පැහැදිලි නොවීය කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දෙතුන් දෙනෙක් කතා කරන කොට ඇත්තටම පැහැදිලි නෑ. එතකොට වාර්තාව ලියන්න බෑ. තමුන් ඉදිරිපත් කරපු එකක්වත් මේ වාර්තාවේ නැත්නම් කියන්න. මෙතන අඩුපාඩුවක් තියෙනවා ඒක හරි. නමුත් ඒ අඩුපාඩුව ඇතිවන්නේ අපෙන්මයි. මෙතන තුන් හතර දෙනෙක් එක පාර කතා කරනකොට ඇහෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** කාටවත් චෝදනා කරන්න නෙමෙයි මම ඒක කිව්වේ. ලබන්නා වූ සිංහල දෙමළ අලුත් අවුරුද්ද සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ටත්, ඒ වගේම කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා විදියට ලේකම්තුමා ඇතුළු සමස්ත බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයටත් සුභ අලුත් අවුරුද්දක් වේවායි කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- වාර්තාවේ තව අඩුපාඩු තියෙනවාද ?

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා, ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ-

7 පිටුව

" ලබුදූව ක්‍රීඩා සමාජයේ නම සුමුදු ක්‍රීඩා සමාජය." ඒක "ලබුදූව ක්‍රීඩා සමාජයේ නම සුරිඳු ක්‍රීඩා සමාජය." ලෙස සංශෝධනය විය යුතුයි.

ඒ වගේම මාර්ගයක් නම් කිරීම සඳහා ලියුමක් ඉදිරිපත් කරලා තිබුණා. මම විතරයි ඒ වෙලාවේ කතා කරේ. එතනදි මම කිව්වා ඒ ලිපිය ලේකම්තුමා සභාවට ඉදිරිපත් කරලා නෑ. ඒක ගැන මම කණගාටුව ප්‍රකාශ කරා. මම විතරයි ඒ මොහොතේ කතා කරේ. එතනත් සභාව පැහැදිලි නොවීය කියලා තියෙන්නේ. ඒ කාරණයට අවධානය යොමු කරවන්න. මම විතරයි එතනදි කතා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සභා වාර්තාව සංශෝධන වලට යටත්ව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- 2019-03-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019-03-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට ඒකමතිකව සභා සම්මත විය.

<u>(ආ) සභාපතිවරයා විසින් කරන ලබන විශේෂ නිවේදන</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ලබන්නා වූ සිංහල දෙමළ අලුත් අවුරුද්ද සතුට, සෞභාග්‍යය සපිරුණු සුභ නව වසරක් වේවා කියලා සියලුම දෙනාට මම ප්‍රාර්ථනා කරනවා.

<u>**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 01. නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය සම්බන්ධවයි. - දෙවන කණ්ඩායම (ඩබ්ලිව්. යූ. පී. ප්‍රේමචන්ද්‍ර මයා, ආණ්ඩුකාර ලේකම්, දකුණු පළාත)

ඒ සම්මන්ත්‍රණය පිළිබඳ අපි ගිය සභාවේදී ඉදිරිපත් කරා. ඒ මුදල වැඩි නිසා සියලු මන්ත්‍රීවරුන්ට සහභාගිවීමේ අපහසුතාවය හේතුවෙන් ඒක නතර කරා. ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි ආණ්ඩුකාර ලේකම්තුමා ඒ සම්මන්ත්‍රණය ගැන නැවත ලිපියක් යොමු කරලා තියෙනවා මේකේ වැදගත් බවක් පෙන්වලා.

කසළ ගැටලුව තියෙනවා අපේ ප්‍රාදේශීය සභාවට. අපි මොකද කරන්නේ මේකට.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මම බලාපොරොත්තු වුනේ මෙහෙමයි. ඔක්කොටම යන්න බෑ. අපි සභා තීන්දුවක් අරගෙන තියමු ආණ්ඩුකාරතුමාගෙන් උපදෙස් අරගෙන මොකක්ද කරන්න පුළුවන් කියලා බලමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** රුපියල් එක්ලක්ෂ අසූපන්දහසයි දවස් දෙකේ පුහුණුවට. කෑම බීම ලබා දෙන්නෙත් නෑ ඒ දවස් දෙකේදී. මොකක්ද මේකේ තියෙන වැදගත්කම. මම නම් විරුද්ධයි මේකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමා කලින් සභාවේ සභාගත කරපු ලිපිය බැලුවද?. කලින් පුහුණු වැඩමුළුවට ප්‍රාදේශීය සභා වලින් ගිහින් තියෙනවා. අපි කුණු ගැටලුවට මැදි වෙලා ඉන්නේ. ආණ්ඩුකාරතුමා කියයි අපි මේ ගැටලුව විසඳගන්න මැදිහත් වුනේ නෑ කියලා.

අපේ සභාවට කුණු දහනය කරන බර්නර් එකක් මිලදී ගන්න බැලුවා. ඒකට රුපියල් ලක්ෂ අනූවක් විතර යනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම නම් දකින්නේ මේ පුහුණුවට වියදම් කරන මුදල බැලුවහම ඒක වැඩක් නෑ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අපිට තියෙන්නේ කසල බැහැර කරන්න ස්ථානයක් නැති ප්‍රශ්නය. මොන පුහුණුවට ගියත් අපිට කසල බැහැර කරන්න ඉඩමක් අවශ්‍යයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක ගැන අදහස් දක්වන්න වෙලාවක් දෙනවා නම් මේ කුණු ප්‍රශ්නය පිළිබඳ මම අදහස් දක්වන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- නෑ ඕන නෑ. මේක අතඇරලා දාමු. ප්‍රශ්නයක් නෑ.

02. චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය පැවරීම. - බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව. (රනිල් වික්‍රමසේකර මයා, පළාත් පාලන කොමසාරිස්, දකුණු පළාත)

අප ප්‍රාදේශීය සභාවේ පොදු ගිණුම (ගිණුම් අංක 0000400935) , කර්මාන්ත ගිණුම (ගිණුම් අංක 0003528344) , සේවක ණය ගිණුම (ගිණුම් අංක 0003528365) සහ නාගරික සංවර්ධන ගිණුම (ගිණුම් අංක 0075833867) යන ජංගම ගිණුම්වල චෙක්පත් අත්සන් කිරීම සඳහා දෙවන අත්සන්කරු ලෙස ප්‍රධාන කළමණාකරණ සහකාර ඉසුරුණි රන්මිණි ලංකාපුර මෙය වෙත බලය පවරා තිබීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. පාරට නමක් යෝජනා කිරීම. (126/සී, හෝළුවාගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය)

හෝළුවාගොඩ දෙවට පාර නොහොත් වැට පාර ග්‍රාම සංවර්ධන මාවත නමින් නම් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. 1988 අංක 74 දරණ පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම. (රනිල් වික්‍රමසේකර මයා, පළාත් පාලන කොමසාරිස්, දකුණු පළාත)

වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන්න කියලා දැනුවත් කරන්න තමයි එම ලිපිය සභා ගත කරේ.

05. බෙරලියදොළ වසමට අයත් යුනිවර්සල් සිටි ළමා උද්‍යානය අසල පිහිටි ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමේ නිලසෙවන කාර්යාලයක් සකස් කිරීම පිළිබඳව එවා ඇති යෝජනාව සම්බන්ධවයි. (ලලින්ද ගමගේ මයා, ප්‍රාදේශීය ලේකම්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)

ඒකට ඉල්ලීමක් ගමේ සමිතියෙන් ලබා ගන්න වෙනවා. ඊට පස්සේ තමයි සලකා බලන්න වෙන්නේ. ගමේ සමිතියෙන් ඉල්ලීමක් තියෙනවා එම ස්ථානයේ ප්‍රජා ශාලාවක් හදන්න කියලා. ඒ ඉඩම වෙන්කරලා තියෙන්නේ ගමේ අයගේ සුභ සාධන කටයුතු සඳහා. මට පුද්ගලිකව කියලා තියෙනවා ගමේ අය මේකට කැමති නෑ කියලා.

**ගරු මන්ත්‍රිනී ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** පක්ෂ භේදයක් බලන්නේ නැතුව එන සල්ලි වලින් වැඩේ කර ගත්තහම හොඳයි නේද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- පක්ෂ භේදයක් නෙමෙයි මෙතන තියෙන්නේ. ඒ මිනිස්සුන්ට ඕන ප්‍රජා ශාලාවක් හදලා එයාලගේ රැස්වීම් තියා ගන්න. නිලසෙවන කාර්යාලය හැදුවම අපිට ඒකේ අයිතියක් නැතිවෙයි, ඒක පාලනය කරන්න බැරිවෙයි කියන හැඟිමක් ඒ අයට තියෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒ කියන්නේ ගමේ අය නිලධාරීන්ව හම්බ වෙන්න හතර තැනකට යන්න කැමතියි කියන එකද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ගමේ ඉඩම් කැබලි තුන්සිය ගාණක පදිංචි වෙලා ඉන්න මිනිස්සුන්ට රැස්වෙන්න තැනක් නැතේ ඕක හැදුවහම. අනිත් එක නාගරික සංවර්ධන අධිකාරියෙන් අවසර ගන්න ඕනේ ඒක වෙන්දේසි ඉඩමක් නිසා. ඒ අය කියනවා මේකට අවසර දෙන්නේ නෑ කියලා. එදා සම්බන්ධීකරණ කමිටුවේදීත් කිව්වා. ඒ අය වෙන්දේසි ඉඩම්වල නිල සේවන කාර්යාල හදන්න අවසර ලබා දෙන්නේ නෑ.

06. හපුගල හන්දියේ සිට ගොඩළිඳවත්ත දක්වා වූ ප්‍රවේශ මාර්ගය සම්බන්ධව. (එස්. කන්නන්ගර මයා, ගොඩළිඳවත්ත, හපුගල, වක්වැල්ල.)

හපුගල හන්දියේ සිට ගොඩළිඳවත්ත දක්වා වූ ප්‍රවේශ මාර්ගය ගොඩළිඳවත්ත මාවත ලෙස නම් කිරීමට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. කරාපිටිය රෝහල ඉදිරිපිට වෙළඳාම් කිරීම සම්බන්ධව (ඩබ්. ජී. උපුල් ඉන්දික මයා, කාසල්හිල් වත්ත, නරාවල)

කරාපිටිය රෝහල ඉදිරිපිට වෙළඳාම් කිරීම සම්බන්ධව සභාවේ විරෝධතාවයක් නොමැති බවට යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාවේ ඒකට විරෝධතාවයක් නෑ. අපි අවසර දුන්නනේ ඒකට. ඒ අය දැන් ව්‍යාපාර කටයුතුත් කරගෙන යනවානේ. පොලිස් ස්ථානාධිපතිතුමාගේ පෞද්ගලික වුවමනාවකට වුන දෙයක් එතනදී වුනේ. දැන් ඒ ගැටලුව නිරාකරණය වෙලා තියෙනවා. ඉදිරියේදී ඒ ගැටලුව ආවොත් අපි ඒකට මැදිහත් වෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දැන් ව්‍යාපාර කටයුතු ඒ අය නැවත කරගෙන යනවා නේ. ඉදිරි කටයුතු වලට යන්නේ නෑ ඒ නිසා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔව් යනවා. ගැටලුවක් වුනොත් අපි මැදිහත් වෙමු.

08. වක්වැල්ල ජන උදාන ගම්මානයට ප්‍රවිෂ්ට වීමට බටුවන්තුඩාව ප්‍රධාන මාර්ගය දෙසට ඉදිකිරීමට යෝජිත වූ අතුරු මාර්ගය (වක්වැල්ල ජන උදාන ගම්මානයේ පදිංචිකරුවන්)

වක්වැල්ල ජන උදාන ගම්මානයට ප්‍රවිෂ්ට වීමට බටුවන්තුඩාව ප්‍රධාන මාර්ගය දෙසට ඉදිකිරීමට යෝජිත වූ අතුරු මාර්ගය සභාව මැදිහත්වී සභා අරමුදලින් මිනින්දෝරු මහතෙකු යොදවා මාර්ගය මැන වෙන් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

09. බෝපෙ පෝද්දල කොට්ඨාශයේ දහම් පාසල් ගුරුවරුන් පුහුණු කිරීම. (ගරු ලේකම් ජ්‍යෙෂ්ඨ පුරවැසි බලමණ්ඩලය - බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය)

මේක සභා යෝජනාවක් විදියට ඉදිරිපත් කරලා සභා තිරණයක් අරගෙන ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යවන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක දැලිපිහියෙන් කිරි කනවා වගේ වැඩක්. මේකට කතා කරොත් කියයි අන්න අබේසේකර මන්ත්‍රීතුමා තමයි විරුද්ධ වුනේ කියලා. නමුත් මේ විදියට

ඉල්ලුවම අපි දෙන්න ගියොත් එහෙම සියලුම සමිති වලින් පොදු කටයුතුවලට කියලා ඉල්ලුවම දෙන්න වෙනවා. මේවායේදී සභාපතිතුමා පැහැදිලි තැනක ඉන්න ඕනේ. මේක ආණ්ඩුකාරතුමාට හරි මහ ඇමතිතුමාට හරි කිවුවම අනුමත කරලා දේවි. ඉල්ලන හැම එකටම දෙන්න වෙනවා. මෙහෙම ගියොත්. මම විරුද්ධ නෑ මේකට.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ජ්‍යෝෂ්ඨ පුරවැසි බලමණ්ඩලය බොහෝ සුභසාධක වැඩ වලට සම්බන්ධ වෙනවා බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ. ගිය පොසොන් පෝය දවසෙත් මේ අය උළුවිටිකේ මහා විද්‍යාලයේදී බැති ගී සරණියකුත් පැවැත්වුවා. අපිට ගැටලුවක් තියෙනවා. මේ ජ්‍යෝෂ්ඨ පුරවැසි බලමණ්ඩලය විසින් දහම් පාසල් ගුරුවරු පුහුණු කිරීමේ වැඩමුළුවක් පවත්වන්නේ මොන විදියටද කියන එක ගැන. මම විශ්වාස කරන විදියට ඒක ජ්‍යෝෂ්ඨ පුරවැසි සංවිධානයකට අයිති කාර්යයක් නෙමෙයි. ඒක ගැන ගැටලුවක් තියෙනවා. දහම් පාසල් ගුරුවරු පුහුණු කිරීමේ වෙනත් ක්‍රමවේද තියෙනවා. අපිට සභාවක් විදියට දෙවිය පනස් දෙනෙකුට දිවා ආහාරයයි, තේ පැන් සංග්‍රහයයි ලබා දෙන්න රුපියල් හැත්තෑ පන්දහසක විතර මුදලක් යාවී. ඒක දැරීම සභාවට ටිකක් අපහසුයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක නරක පූර්වාදර්ශයක්.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- මම හිතන්නේ මේක ජ්‍යෝෂ්ඨ පුරවැසි බලමණ්ඩලයට අයිති නෑ නෙමෙයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා හෝ කරන්න ඕන කාර්යයක් මේ. කවුරුහරි මේක කරන්න ඉදිරිපත් වෙනවා නම් ඒකට සහයෝගය ලබා දීම වැදගත්. දහම් පාසල් අධ්‍යාපනය කියන්නේ සමාජයේ වැදගත් කටයුත්තක්. මේ කටයුත්තේදී සභාව විදියට මැදිහත් වෙලා සහයෝගය ලබා දෙන්න පුළුවන්නම් වටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මේක කරන්න පුළුවන් ක්‍රමවේදයක් තියෙනවා. මේක ගැන ඇවිත් සාකච්ඡා කරලා වැඩපිළිවෙල ගැන දැනුවත් කරලා, සම්පත්දායකයෝ ගැන දැනුවත් කරලා වැඩපිළිවෙල ඉදිරිපත් කරන්න ඕන. එතන අඩුපාඩුවක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- මේක ජ්‍යෝෂ්ඨ පුරවැසි බලමණ්ඩලයට අදාළ කාරණයක් නෙමෙයි කියන එකට මම මේ කතා කරේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය සභාවෙන් හෝ බෝපෙ පෝද්දල බලප්‍රදේශයේ ඉන්න දහම් පාසල් ගුරුවරුන්ට පුහුණුවක් ලබා දෙන්නේ නැත්නම් ඒකට සමිතියක් මැදිහත් වෙලා හරි කරන කොට වචනයකින් හරි සහයෝගය ලබා දෙන එක වැදගත්. අබේසේකර මන්ත්‍රීතුමාට නෙමෙයි මම මේ කියන්නේ. අපේ චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා කියපු කතාවට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා දරපු මතය හරි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- එතුමා කිවුවේ මේක ජ්‍යෝෂ්ඨ පුරවැසි බලමණ්ඩලයට අදාල නෑ කියලනේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුත් කරන්නේ නැත්නම්, ප්‍රාදේශීය සභාවෙනුත් කරන්නේ නැත්නම් මේ කටයුත්ත කරන අයට සහයෝගය ලබා දීම අපේ යුතුකමක් වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඕක දිගින් දිගට කතාකරන්න අවශ්‍ය නෑ. ඕක ඊට වඩා ක්‍රමවත්ව එන්න ඕන. මෙතනට ඇවිත් මාත් එක්ක කතා කරලා, මෙන්න මේකයි වැඩ පිළිවෙල, සම්පත් දායකයෝ විදියට එන්නේ මේ අය, ඒ විදියට ආවනම් අපිට සභා තීන්දුවක් ගන්න තිබුණා. අනිත් එක කාල වකවානුවක් ගැන සඳහන් වෙන්නේ නෑ මේකේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- ඒවා ගැන තාම කතා කරේ නෑ. ප්‍රාග්ධනය සොයා ගැනීමේ කටයුත්ත තාම කෙරෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එහෙම නම් ඊළඟ සභාවකට මේක විධිමත් ආකාරයට ඉදිරිපත් කරන්න. ඊට පස්සේ අපි සභා තීන්දුවක් ගමු.

**(ආ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** ඃ- නැත

**(ඇ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**<u>ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමාගෙන් අවසරයි. සියලුම මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, 2019 සිංහල හා දෙමළ හින්දු අලුත් අවුරුද්ද අපේ ගරු සභාපතිතුමාටත්, අපේ මන්ත්‍රීවරුන්ටත්, මන්ත්‍රීවරියන්ටත් ඒ වගේම විපක්ෂ නායකතුමාටත් සුභම සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම බෝපෙ පෝද්දල ජනතාවටත් ලබන්නා වූ අලුත් අවුරුද්ද වාසනාවන්ත අලුත් අවුරුද්දක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

01. උප සභාපති සහ මන්ත්‍රීවරුන්ගේ කාර්යාලයට අවශ්‍ය උපකරණ ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- 02. උප සභාපති සහ මන්ත්‍රීවරුන්ගේ කාර්යාලයට දුරකථන හා වායුසමීකරණ පහසුකම් ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- 03. උප සභාපති සහ මන්ත්‍රීවරුන්ගේ කාර්යාලය මාසික කමිටු රැස්වීම් පැවැත්වීමට සුදුසු ලෙස සැකසීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

දෙවැනි යෝජනාව ටිකක් සලකා බලන්න ඕන. එතැන රැඳී ඉන්නේ නැනේ දිගටම. ඒක පොඩි ගැටලුවක්. ඒක බලන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- මට, මන්ත්‍රීවරුන්ට මේ සභාවට ඇවිත් ඉන්න තැනක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒකට තමයි ඒක හැදුවේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- ඒ කාර්යාලයට නෙමෙයි මගේ යෝජනාව. මීට පෙර උප සභාපති හාමුදුරුවෝ ඉඳපු කාර්යාලය මට ලබා දෙන්න කියලා මම ඉල්ලීම් කරනවා. මම නිරීක්ෂණය කරා අලුතෙන් අලුත්වැඩියා කරපු කාර්යාලය. ඒකට මම එන්නේ නෑ ඒක සකස් කරාට. මෙතෙක් උප සභාපතිතුමාගේ කාර්යාලය ලෙස සභාපතිතුමාගේ කාර්යාලය අසල ඇති කාමරය තමයි භාවිතා කරේ. ඒක මට ලබා දෙන්න කියන ඉල්ලීම තමයි මම කරන්නේ. මෙතන සුදුසු නෑ. මට සභාපතිතුමාව හදිසියේ හමුවන්න වුනත් පුළුවන් ඒ කාමරය ලබා දුන්නම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එතන ඉන්න නිලධාරීන් ටික කොතනටද යන්නේ එතකොට.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- උප සභාපතිතුමාගේ කාර්යාලය විදියට පාවිච්චි වුන තැනක් තිබුණනේ මේ සභාවේ. ඒ ස්ථානය මට ලබා දෙන්න කියලා මම ඉල්ලීම් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- තව නිලධාරීන් පස් දෙනෙකුගේ අඩුවක් තියෙනවා. ඒ පහ පැත්තකට තියමුකෝ. දැන් එතන ඉන්න නිලධාරීන් කොතනටද දාන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- ඒ කාමරයට වඩා ඉඩකඩ තියෙනවා දැනට අලුත්වැඩියා කරපු ස්ථානයේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- එතකොට නිලධාරීන් අතර සම්බන්ධතාවයක් නැනේ. නිලධාරීන් ගෙන්ව ගන්න විදියක් නැනේ. නිලධාරීන් අවශ්‍ය වුනහම මට කැඳවා ගන්න තියෙන්න ඕන. ප්‍රජා සංවර්ධන නිලධාරි, පරිසර නිලධාරි මාත් එක්ක නිරන්තරයෙන් සම්බන්ධ වෙනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** :- ඊට ආසන්න තැනක් ඒ නිලධාරීන්ට ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- අලුතෙන් සභා ගොඩනැගිල්ලක් හදන්න දැන් මුදලුත් වෙන් කරන්න තීරණය වෙලා තියෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** :- දැන් සභාව පිහිටුවලා අවුරුද්දකටත් වැඩියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- උප සභාපතිතුමා මට දැන් මොකක්ද කරන්න කියන්නේ. ඒ නිලධාරීන් කොහේද ඉන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** :- අලුතෙන් අලුත්වැඩියා කරපු ස්ථානය ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- මුල ඉඳන්ම මේක කිවුවනේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** :- මට කාර්යාලයක් එපා. ඔබතුමා ඒ වැඩ කටයුතු ටික කරගෙන යන්න. ගැටළුවක් නෑ. මගේ යෝජනා සියල්ලම මම ඉල්ලා අස්කර ගන්නවා. ගැටළුවක් නෑ. මේ සභාවේ මම 2011 වර්ෂයේ ඉඳගෙන මන්ත්‍රීවරයෙක් විදියට ඉන්නවා. දැනට උප සභාපති තනතුර දරනවා. මට අයිති කාර්යාලය මට නැත්නම් මට ප්‍රශ්නයක් නෑ. ඔබතුමාට දෙන්න පුළුවන් උපරිම සහයෝගය මම ලබා දෙනවා. ඒක මම පොරොන්දු වෙනවා. මගේ සියලු යෝජනා මම ඉල්ලා අස්කර ගන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- විකල්පයක් මට ඉදිරිපත් කරන්න. දැන් අවුරුද්දක කාලයක් තිස්සේ මේ ස්ථානය යෝජනා වෙලා තිබුණා. ඔබතුමා අදනේ ඕක කියන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** :- සභාපතිතුමා මම ඒක ඇවිත් බැලුවා. ඒ අලුත්වැඩියාව ඇස්තමේන්තු කරලා තිබුණ විදිය අනුව මට සෑහිමකට පත්වෙන්න බෑ. ඒ හින්දා මෙතෙක් උප සභාපතිවරයා ඉඳපු තැනක් තිබුණා. ඒ තැන මට ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඒ තැන මාදුගොඩ සභාපතිතුමා අයින් කරා. හරි කමක් නෑ. උප සභාපතිතුමාට ඒ කාමරය ලබා දෙන්න. ඒ නිලධාරීන්ට වෙනත් ස්ථානයක් ලබා දෙන්න. ලේකම්තුමා වගකීම ගන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** :- එතකොට මන්ත්‍රීවරයෙකුට ඇවිත් සභාවේ ඉන්න අවශ්‍ය නැද්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- අවශ්‍යයි. ඒ අවශ්‍යතාවය තමයි ඉෂ්ට කරේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** :- ඔබතුමා ඒ කාර්යාලය බැලුවද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- කලින් එකමනේ. අලුත්වැඩියා කරපු එක විතරනේ කරේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** :- මගේ යෝජනා සියල්ලම මම ඉල්ලා අස්කර ගන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඒ නිලධාරි ඉන්න ස්ථානය උප සභාපතිතුමාට ලබා දෙන්න. ඔබතුමා මාත් එක්ක කතා කරේ නෑ මේ ගැන දැන් කියනකම්. ඔක්කොම අලුත්වැඩියා කරාට පස්සේ ඔහොම කියන එක අසාධාරණයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** සභාපතිතුමා ඇත්තටම මේ සභාවේ එහෙම සම්ප්‍රදායක් තිබුණේ නෑ ඉස්සර අපි එන මුල් කාලේ. උප සභාපතිතුමාලා ආවේ සභාව දවසට

විතරයි. ඒ සම්ප්‍රදාය ඇතිකරා අපි ආවට පස්සේ. ඒ කාලේ ඉඳපු සභාපතිතුමාලා අභිමානයෙන් හිටියා. මොකද කවුරුවත් අත දාන්නේ නෑ. සභාව දවසට ආවා. නැත්නම් එන්නේ නෑ ඒ කාලේ. සුගත් මන්ත්‍රීතුමා දන්නවා. එන දවසට සන්තෝෂ වෙලා ගිය එක විතරයි වුනේ.

මෙතන තියෙනවා ප්‍රශ්නයක් නිලධාරීන් අඩුයි කියන එක. සභාවේ වැඩ එකපාරටම වැඩි උනේ නෑ මහා විශාල විදියට. මේ ප්‍රශ්නයට නෙමෙයි මේ දැන් කතා කරන්නේ. නිලධාරීන් අඩුයි අඩුයි කියනවා. අද වෙනකොට මම දන්නවා නිලධාරීන් කී දෙනෙක් හැරි හැරි ඉන්නවද කියලා. නිලධාරීන් විදියට දාලා ඉන්න අය හැරි හැරි ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අබේසේකර මන්ත්‍රීතුමා ඔබතුමා අනවශ්‍ය මාතෘකාවකට යන්නේ. ඔබතුමා චෝදනා කරනවා වැඩක් කරන්නේ නෑ කියලා. අදටත් අපිට වීථි පහන් නඩත්තු කරන විෂය භාර දෙන්න නිලධාරියෙක් නෑ. නිලධාරි අඩුවක් නෑ කියලා කියන්න බෑ.

දැන් මතුවුණ කාරණා ගැන කතා කරන්න. අනවශ්‍ය දේවල් ගැන කතා කරන්න එපා. උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ගේ කාර්යාලය ගැන කතා කරමුකෝ. ඔබතුමා කියන එකේ එක පැත්තක් ඇත්ත. එක පැත්තක් නෑ. අදටත් අනතුරුදායක ගස් සම්බන්ධව වෙනම නිලධාරියෙක් පත් කරන්න බැරිව ඉන්නවා. එක නිලධාරියෙක් විෂයන් තුනක් හතරක් කරනවා. වීථි පහන් නඩත්තු කරන විෂය භාර දෙන්න නිලධාරියෙක් නැතුව ඉන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා දැන් වරිපනම් විෂය කරන අය බලන්නකෝ. මේ වරිපනම් විෂය කරන අය මොකද කරන්නේ කියලා බලන්න. පරගණක ගත කරලා තියෙන්නේ. හරි ලේසියි. ඒත් මිනිස්සු ඇවිල්ලා රස්තියාදු වෙලා යන අවස්ථා තියෙනවා. අපි නෙමෙයි ඒවා ගැන බලන්න ඕන. අපි ඔබතුමන්ලාට යම් යම් දේවල් කිව්වා. දැන් කියන්නේ නෑ. එහෙම කියලා නිකන් මේවා වෙන්න ඕන නෑ. අපි දැන් මේ ආවේ සභාවට දායකත්වය දීලා වැඩ කරන්න. අපිට පේනවා වෙන දේවල්. මේ සභාව හරියට තිබුණොත් එකේ පළවෙනි ගෞරවය එන්නේ ඔබතුමාට.

නමුත් පසුගිය කාලේ උප සභාපතිතුමාලා දිගින් දිගටම හිටියේ ඒ කාමරයේ. එකේ වෙන කතාවකුත් තියෙනවා. එන මිනිස්සුන්ට හම්බවෙන්න පහසුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මට ඊලඟ විකල්පයක් කියන්න දැන්. ඒ ඉන්න අයට කොතනද දෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අලුත්වැඩියා කරපු තැන ඊට වැඩි ඉඩ ප්‍රමාණයක් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එතනට දාලා නිලධාරීන් මට ඕන වුනාම කොහොමද ගෙන්වන්නේ. ඒ නිලධාරීන් හැමදාම වගේ අවශ්‍ය වෙන අය. ඒ තීන්දුව ගමුකෝ. ඒක කොහාමත් තව වැඩි කාලයක් නැනේ. ඒ පිළිබඳව අපි සාකච්ඡා කරලා තීන්දුවක් ගමු. මම දකින හොඳම දේ තමයි මන්ත්‍රීවරු ඉන්න ඕන ඉස්සරහ. මොකද ප්‍රශ්නයක් ආවම මිනිස්සුන්ගේ මෙතන ඇවිත් මන්ත්‍රීවරුත් එක්ක කතා කරලා ඒක විසඳගන්න පුළුවන්. නැත්නම් සභාපති හම්බවෙලා කතා කරලා ඒක විසඳගන්න පුළුවන් ඒක බේරුමක් වෙන්නේ නැත්නම්. අතනට ඇවිත් සභාපතිතුමා හම්බවෙලා ප්‍රශ්නය බේරගත්තොත් මම හිතන්නේ නෑ අයේ උප සභාපති හම්බවෙන්න එයිද කියලා. කැමැත්තක් කරන්න. කැමති විදියකට හරි ගස්සලා දෙන්නම්.

<u>ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරු, මන්ත්‍රිවරියන්ට මම සුභ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරනවා.

( ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

04. පියදිගම කිංග්ස්කෝට් අතුරු මාර්ගය වැඩි දියුණුවීමෙන් වැඩි ජනගහනයක් එම මාර්ගය භාවිතා කරනු ලැබේ. රථවාහන අධික වේගයකින් එම මාර්ගය හරහා ගමනාගමනය සිදුවන බැවින් රිය අනතුරු සිදුවීමේ ප්‍රවණතාවය වැඩිය. මේ හේතුව නිසා එම මාර්ගයේ උදේක මහතාගේ නිවස අසල මාර්ග බාධකයක් (බම්පර් එකක්) ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පසුගිය දිනවල ප්‍රීමික්ස් ව්‍යාපෘතිය කරගෙන යනකොට මතුවුන ගැටලුවක් නිසා තමයි මේ යෝජනාව ඉදිරිපත් කරේ. එතනදි පියදිගම කිංග්ස්කෝට් වෙන්දේසි ඉඩමට හැරෙන පාරේ කලින් දාලා තිබුණා බම්පර් දෙකක්. ඒකේ පරස්පර විරෝධිතාවයක් නිසා උනේ. කිංග්ස්කෝට් වෙන්දේසි ඉඩමේ අලුතෙන් නිවාස හදාගෙන මිනිස්සු පදිංචි වුනා. ඒ ආවට පස්සේ මේකේ ලොකු ගෙවල් හැදුනා. කලින් තිබුනේ උදේක මහතාගේ නිවස අසල පරේ ගෙවල් හතරක් විතර. ඊට පස්සේ මේක කිංග්ස්කෝට් පැත්තට යන්න පුළුවන් වෙන්න මේ පාර සම්බන්ධ වුනා. ඊට පස්සේ ඒකට අල්ලපු ඉඩමත් වෙන්දේසි කරා. වෙන්දේසි කරන කොට පාරවල් දෙකම එකතු කරලා අඩි විස්සක විතර පාරක් තියෙනවා. මේ පාරේ කලින් ප්‍රදේශවාසීන් හිටියේ පවුල් හතරක් පහක් විතර. ඒ පවුල් වලට යන්න තිබුණේ අඩි අටක විතර පාරක්. එතකොට මේ පාරේ කාටවත් අවහිරයක් තිබුණේ නෑ. අවදානමක් තිබුණේ නෑ. නමුත් දැන් පාර භාවිතා කරන පවුල් ප්‍රමාණය වැඩියි. පාර පළලිනුත් වැඩිවෙලා තියෙනවා. ඒ නිසා බම්පර් දෙකක් දාලා තිබුණා. ඒක කරේ කලින් ඉඳපු පවුල් වල අය. නමුත් මෑත කාලයේදී සභාව නොතිබුණ ලේකම් පාලනය යටතේ තිබුණු කාලයේදී ඒ කිංග්ස්කෝට් වෙන්දේසි ඉඩමේ ඉන්න අයයි වෙනත් ප්‍රදේශවාසීන් ඉල්ලීම් කළා මේ බම්පර් දෙක කඩන්න කියලා. මෙතුමන්ලා ඒ ඉල්ලීමට ඒක අයින් කළා. මෙතුමන්ලා හරි. මෙතුමන්ලා එතන තියෙන තත්වය දන්නේ නෑ. අපි හිටියනම් ඒක කියනවා. නමුත් මේක අවධානය යොමු කළ යුතු කාරණයක්. මේක අනිවාර්යෙන් හදන්න ඕන. මොකද නැත්නම් මම මේක ගැන කතා කරන එකේ වැඩක් නෑ. අපි ජනතාව වෙනුවෙන් දෙයක් කතා කරන්නේ ජනතාවගේ වුවමනාව හින්දා. ඒකේ දෙපැත්තම තියෙනවා. මේක හැදුවම ඕන නම් මට ඡන්දෙ නැතිවෙයි. ඒකත් කියන්න ඕනනේ. ඒ අවදානම් දෙකම තියෙනවා. හැබැයි නොදැම්මොත් ගමේ පරණ මිනිස්සු ඡන්දෙ දෙන්නෙ නෑ මට. මට නෙමෙයි අපිට දෙන්නේ නෑ. ඇත්ත කතාව ඒක. අපි මේ සභාවට ඇවිත් තියෙන්නේ දේශපාලනයට. දේශපාලන පක්ෂ වලින් තමයි පත් වෙලා ඇවිත් තියෙන්නේ. ඒක අපි ප්‍රීමික්ස් ව්‍යාපෘතිය තුළින් කරන්න ගියා. නමුත් ඒකට තාක්ෂණ නිලධාරී දිනූෂ මහත්මයා අදිමදි කලා. ඊට පස්සේ කිව්වා. සභාවට යෝජනාවක් කරලා ඒක කරන්න කියලා. ඒක නිසා අවදානම නැති කරන්න විශාල වශයෙන් නෙමෙයි. සාමාන්‍යය වශයෙන් අඟල් කීපයක් විතර උසට බම්පර් එකක් දාන්න ඕන. කාලය ගත්තේ මේක ගැන තියෙන අවදානම පෙන්වා දෙන්න. නලීන් හේවගේ මන්ත්‍රීතුමා මේකට අතදාලා තිබුනා මේක ගලවන්න කියලා. එතනදී ඒ ගමේ පරණ මිනිස්සුන්ගේ ඉල්ලීම තමයි මේ ඉල්ලීම. මේක සකස් කරලා දෙන්න කියලා ඉල්ලීම මම කරනවා.

ඒවාගේම සභාපතිතුමා මට පොඩි අසාධාරණයක් වුනා මේ ප්‍රීමික්ස් වැඩ පිළිවෙල තුළ. මුලින් මම මේක ඉල්ලන්න ගියේ නෑ. අපේ වැඩපිළිවෙල මුල ඉඳන් ලයිට් දාන ඒවා, පාරවල් සුද්ද කරන ඒවා කෙරුන හින්දා. පෝද්දල පැත්තෙන් තමයි ඒක පටන් ගත්තේ. අපි ඒකට විරුද්ධ වුනේ නෑ. නමුත් දැන් සෑම කොට්ඨාශයකම ඒ ටික කෙරිලා තියෙනවා. මාගේ කොට්ඨාශයෙයි, ගිංතොට කොට්ඨාශයෙයි මේක හරියට කෙරිලා නෑ. මගේ කොට්ඨාශයේ කෙරෙද්දි පළවෙනි දවසේ ප්‍රීමික්ස් කියුබ් කාලක් විතර ආවා. ඒක පැයකින් විතර දාලා ගියා. ඇත්ත කතාව ඒක. මමත් එතන හිටියා. ඊට පස්සේ දෙවෙනි දවසේත් යම් ප්‍රමාණයක් ආවා. සම්පූර්ණයෙන්ම ප්‍රීමික්ස් කියුබ් එකක් දාන්න ඇති. පාරේ මුලටික කෙරුනේ නෑ. පසුගිය දවස්වල මලගෙයක් වුනා. ඒ මලගෙදර ගියාම මට කිවුවා පාරේ මුල ටික ප්‍රීමික්ස් කරපු නැති එක ගැන. ලොකු ප්‍රශ්නයක් අපිට. ගමේ මලගෙදරකට යන්න බෑ. එක්කෝ මේක නොදාම ඉන්න ඕන. භාගයක් කරලා අනිත් ටික නොදැම්මහම අපිට නරක විදියට තමයි කතා කරන්නේ. ඒක නිසා මම ගරු සභාවෙන් ඉල්ලන්නේ කවුරුත් මේක ගැන අවධානය යොමු කරලා වැඩ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මන්ත්‍රීතුමා ඒක එහෙම වුනේ ගෙනාපු කෝලාස් ටික ඉවර වුන නිසා. අලුතින් කෝලාස් ගෙනාවහම පාරේ ඉතුරු ටික කරලා දෙන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක මම පිළිගන්නවා. අද වෙනකොට ප්‍රීමික්ස් ව්‍යාපෘතිය නැවතිලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කවදද නැවතුනේ. දැන් ඕනනම් දවස් තුනක්, හතරක් ඇති.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපිට වෙන අසාධාරණය හින්දා මෙහෙම කියන්නේ. අඬන්න එපැයි කිරි හම්බවෙන්න. නැත්නම් හම්බ වෙන්නේ නෑ. සමස්තයක් විදියට මුළු

කොට්ඨාශයටම සාධාරණයක් ඉෂ්ට කරන්න මම මේ කතා කලේ. ඒ කාරණයේ යම් අඩුපාඩුවක් තියෙනවනම් ඒක ඉෂ්ට කරන්න.

අනිත් කාරණය තමයි. මම මුලින්ම ගෙනාවා කොට්ඨාශ විදියට සේවාවන් ලබා දෙන්න කියලා. දැන් කම්කරු මහතුන් ඒ විදියට හම්බ වෙනවා. අපි මෙතන කතන්දර හදා ගන්න අවශ්‍ය නෑ. වීථි පහන් නඩත්තුවත් ඊදිනටම ලබාදෙන්න කියන ඉල්ලීම මම කරනවා. සභාවේ මන්ත්‍රීවරු කැමතිවේද කියලා මම දන්නේ නෑ. පාර සුද්ද කරන්නේ කවදද කම්කරු මහත්වරු, එදාටම වීථි පහන් සවිකරන්න අවශ්‍ය කටයුතු කරලා දෙන්න. හේතුව තමයි අදාළ මන්ත්‍රීවරයාට ගිහින් කාරණා දෙකම අධීක්ෂණය කරන්න පුළුවන්. පාරවල් සුද්ද කරන්න දින දෙනවා වගේම වීථි ලාම්පු සවිකරන්නත් දින ලබා දෙන්න. අපි අපහසුතාවයට පත්වෙනවා නැත්නම්. බල්ලා ඉන්න කොට පොල්ල නෑ. පොල්ල තියෙන කොට බල්ලා නෑ. ඒ වගේ ප්‍රශ්නයක් දැන් තියෙන්නේ උදාහරණයකට ලෙකෝ ලයින් එකේ උදේ වරුවේ විදුලිය තියෙනවා. ඒ පැත්තේ වීථි පහන්වල අලුත්වැඩියාවක් තියෙනවානම් උදේ වරුවේ කරන්න පුළුවන්. හැබැයි මම කියන්න හදන්නේ වෙන කාරණයක් නෙමෙයි. විදුලි කාර්මිකයෝ කියනවා මන්ත්‍රීතුමා ගියාට වැඩක් නෑ විදුලිය නැති නිසා අලුත්වැඩියා කටයුතු කරන්න බෑ කියලා. මේ අපි අල්ල ගනිපු දේවල්. ඒ පැත්තේ අලුත්වැඩියා කටයුතු සිදු කරන්න පුළුවන්. ඒ වාගේ කාරණා තියෙනවා. එයාලා බලන්නේ පුළුවන් තරම් වැඩ නොකර ඉඳීමේ න්‍යාය පත්‍රයට යන්න තමයි. පැහැදිලිවම ඒක කියන්න ඕන. අපිට දැන් කාගේවත් හිත හොඳ කරලා වැඩක් නෑ. හිත හොඳ කරන්න අපි වැඩ කරලා බැලුවා. ඒක හරියට කෙරෙන්නේ නෑ. හිත හොඳ වෙන්නේ නෑ. මේක අපේ පෞද්ගලික දෙයක් නෙමෙයි. පොදු දේවල්. එයාලට පඩියක් දෙනවා. එයාලට මන්ත්‍රීවරු පත්වීම් දීලා තියෙනවා. අන්තිමට මන්ත්‍රීවරයාටත් නොසලකා හරින තත්ත්වයක් තමයි මේ සියලු අයගේ ගාව තියෙන්නේ. මම 1997 වර්ෂයේ මේ ප්‍රාදේශීය සභාවට ආවේ. මම කම්කරු මහත්වරු, මහත්මීන් හතරක් පහක් මේ සභාවට ඇතුලත් කරා. මේ කාරණයට අවධානයට යොමු කරන්න කියලා මම හැම මන්ත්‍රීවරයෙකුටම කියන්නේ. අද ඒ ගෞරවය සභාපතිවරයාටවත්, මන්ත්‍රීවරයාටවත් ලැබෙන්නේ නෑ. එහෙම තත්ත්වයක් ඇවිල්ලා තියෙන්නේ. නිලධාරි මහත්වරුන්ටවත් ඒ තත්ත්වය තියන්නේ නෑ.

මම ඊයේ පෙරේදා මලගෙදරක ගියා. මේ ප්‍රශ්නය කතා කරා එතනදි. මගේ යාලුවෙක් කිව්වා මන්ත්‍රීතුමා ඔබතුමාගේ සභාවේ කම්කරු මහත්තයෙකුට කියන්න කිව්වා හාෆ්ෂීට් එකක් ගේන්න කියලා. පමණක් වෙලාවට ගේනවා කිව්වා. පමණක් වෙලාවට ගේන එකක් නෑ කිව්වා. ගේන්නේ නැති ගණන් ගන්නේ නැති අය ඉන්නවා කිව්වා. හැබැයි ඔයාගේ යටතේ පෞද්ගලිකව වැඩ කරන කෙනෙකුට කියන්න කිව්වා හාෆ් ෂීට් එකක් ගේන්න කියලා. එයා ඉක්මනට ගේනවා කිව්වා. ගෙනත් නොදුන්නොත් මොකද වෙන්නේ. ගේන්න බැරිනම් ඔයා අයින් වෙන්න කියලා රස්සාවෙන් අයින් කරනවා කිව්වා. හැබැයි මේකේ ඉන්න කම්කරු මහත්වරු අපිට අස්කරන්න බෑ. ඒ අය මානව හිමිකම් යාවි. මන්ත්‍රීකෙනෙක් අල්ල ගනීවි. සභාපතිතුමාට කියාවී. මේ හුට්ටපප්පර හින්දා මේ බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභාවේ වැඩ කිරීමේ අපහසුතාවයක් තියෙනවා.

**(සභාව තේ පානය සඳහා කල් තබන ලදී.)**

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමාටත්, උප සභාපතිතුමාටත්, සියලුම මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන්ටත්, ලේකම්තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයටත්, මාධ්‍යවේදීන්ටත් සුභම සුභ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරනවා.

යෝජනා ඉදිරිපත් කිරීමේදී ලොකුම කලකිරීමක් තියෙනවා. අපේ ප්‍රදේශයේ කොට්ඨාශයේ වැදගත් වන යෝජනා ගෙනාවත් ගොඩක් දුරට ඒවා ඉන් ඉදිරියට ක්‍රියාත්මක විමේදී ලොකු ගැටලු ගොඩක් තියෙනවා. මම වාර්තාවක් හදාගෙන යනවා අපි ගෙනාපු වැදගත් යෝජනාවල ක්‍රියාත්මක නොවුන ඒවා සම්බන්ධව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මොනවාද ඒ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දැන් අපි උදාහරණයක් විදියට ගමු ජලය පිළිබඳ ගැටලුව. ඔබතුමා දිනයක් දා ගන්නවා කිව්වා ජල සම්පාදන ආයතනයට යන්න. හැබැයි කිසිම දිනයක් දා ගත්තේ නෑ. සභාවාර තුනක් විතර ගියා. මම විශේෂයෙන්ම මාධ්‍යවේදීතුමියට ස්තුතිවන්ත වෙනවා එතුමිය ඒ ප්‍රශ්නය පිළිබඳ මාධ්‍යයට දීලා ඒ හරහා විශාල දෙයක් කරා. මට ජනතාවත් කතා කරා. අදාළ ආයතනයත් කතා කරා. පැය විසිහතරම වතුර ලබා දෙන්න නොහැකි

වුනත්, ඉල්ලුම්කරුවන්ට වතුර ලබා දෙන ක්‍රමවේදයක් කඩිනමින් හදනවා කියලා කිවුවා. සමහරු කිවුවා මේ යෝජනාව ඉල්ලා අස්කර ගන්න කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ සම්බන්ධයෙන් ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමේදී කතා කරා. වජිර ඇමතිතුමා කිවුවා වතුර ටැංකියක් තියෙනවා සූරියවැව. නිකං තියෙන ඒ ටැංකිය ගෙනල්ලා සවි කරන්නෙයි කිවුවා මෙහේ. ලක්ෂ පනහක් විතර යාවි කිවුවා ඒ ටැංකිය ගෙනල්ලා සවි කරන්න. ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් ඒ ලක්ෂ පනහක මුදල ලබා දෙන්නම් කිවුවා ඕනම වෙලාවක. නමුත් නිලධාරීන් මෝඩකමට මේක මඟ අරිනවා. ඊයේ පෙරේදා දවස් දෙකේ වතුර නැත්තටම නැති වුනා. ඊට පස්සේ මම ජල සම්පාදන මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකරුට කතා කරා. ඇමතිතුමා මට කිවුවා කළමනාකාරතුමා ගාව ඉඳගෙන මට කෝල් එකක් දෙන්න කියලා කිවුවා. මේ අය වැඩේ කරන්නම් කියලා කියනවා. නමුත් මේ අය වැඩේ කරන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එතන ඒ වැඩේ ලක්ෂ පනහක් දීලා බේරන්න බෑ. ලක්ෂ පන්දහස් හාරසීයක් යනවා වැඩේ ඉවර කරන්න. ඒක අපිට අදාළ කාරණයක් නෙමෙයි. වර්තමාන ආණ්ඩුවට අදාළ කාරණයක්. නියත වශයෙන්ම මම කියන්නේ සභාපතිවරයා විදියට අපේ එකතුවෙන මන්ත්‍රීවරු එකතු කරගෙන, මිනිස්සු එකතු කරගෙන ජල සම්පාදන මණ්ඩලය වටලනවා. ඒ ඇරෙන්න වෙන දෙයක් කරන්න නෑ. අපි ලෑස්ති වෙමු ඒකට. හැකි ඉක්මනින් ඒක ලෑස්ති කරනවා. අපි මැතිවරණයේදී දීපු පොරොන්දුවක් ඒක. වක්වැල්ලෙන් තමයි ගාල්ලට, අහංගමට සියලු ස්ථාන වලට වතුර ගෙනියන්නේ. වක්වැල්ලේ ජල පොම්පාගාරය තියෙන්නේ අපේ බල ප්‍රදේශයේ. බොහොම පැහැදිලිව කියන්නේ අපි ඒක වටලනවා. අවුරුද්දෙන් පස්සේ 25 වෙනිදා වෙන කොට ඕක වටලන්න වැඩ කටයුතු ලෑස්ති කරනවා. අනිවාර්යයෙන් ඒ මට්ටමට යන්න වෙලා තියෙන්නේ. ඉල්ලීම් කර කර ඉඳලා වැඩක් නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 05. කරාපිටිය ගොඩකන්ද ග්‍රාම නිලධාරි වසමේ ඉදිකරමින් පවතින රෝහල් ගොඩනැගිල්ල අවට භූමිය ප්‍රදේශයටම ඩෙංගු මදුරුවන් බෝකරන මුලස්ථානය බවට පත්ව ඇත. පසුගිය වකවානුව තුල එහි සේවකයන් ඇතුලුව 200කට වැඩි පිරිසකට ඩෙංගු රෝගය වැළඳින. ඉදිකිරීම් කටයුතු සිදු කළද, ජලය බැස යාමේ ගැටලුවට විසඳුමක් ලබා නොදීම මේ සඳහා මූලික හේතුව වී ඇත. මේ සඳහා විසඳුම් ලබා දීමට අදාළ ආයතනයට නොහැකි නම් අප ප්‍රාදේශීය සභාවට මෙම කඩොලාන සහිත බිම් කොටස පවරාගෙන ගැටලුව විසඳීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අවුරුදු තුනක කාලය තුළ විශාල ඉදිකිරීමක් කරත්, ජලය බැස යාමේ ක්‍රමවේදයක් එතන හැදුවේ නැ. කඩොලාන සහිත පරිසරයක් මේක. මේ පරිසරය අපි සභාවෙන් හරි ආරක්ෂා කරලා ඩෙංගු ගැටලුවට විසඳුම් ලබා දිය යුතුයි. ජස්ටින් කන්ද ප්‍රදේශයේ විශාල ජල කඳක් ඇවිත් රෝහල් භූමියේ කඩොලාන පරිසරයේ රැඳුනා. ඒ ජලය කොටසක් කරාපිටිය පැත්තටත්, තවත් කොටසක් ගොඩකන්ද පැත්තටත් බැස ගියා. කඩොලාන තියෙන ප්‍රදේශයේ ජලය රැඳිලා ඉතිරි ඒවා ගලාගෙන ගියා. දැන් මේක ගොඩකරන්න සූදානමක් තියෙයි කියලා මම දකිනවා. ගොඩකිරීම තුල විශාල ගැටලුවක් තියෙනවා ප්‍රදේශයේ ජීවත් වෙන අයට වැහි කාලය ආවහම ජලය කොහාටද යන්නේ කියන එක ගැන. කඩොලාන ප්‍රදේශයේ රැඳෙන ජලය අවසානයේ යන්නේ කොහාටද?. මේක එක එක නිලධාරීන්ගේ, පුද්ගලයන්ගේ අවශ්‍යතාවය මත මේ කඩොලාන ප්‍රදේශය ගොඩකරන්න දෙන්න බෑ. අනිත් එක ඩෙංගු මදුරුවන් ඉන්නවා කියලා කියනවා. පහුගිය වකවානුව තුල මම දැක්කා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කාණුවක් හදලා තියෙනවා. කාණුව හදලා තියෙන්නේ අඩි එකහමාරක් පාරට වැඩිය ඉහලින්. මේ මොහොත වන විටත්, මදුරු කීටයෝ දහස් ගණනක් ඒ කාණුවේ ඉන්නවා. පෙරේදා මම එතනින් යනකොට කතා කරලා කිවුවා ගේ ඉස්සරහ තියෙන කාණුවේ මදුරු කීටයෝ ඉන්නවා කියලා. හදපු මිනිස්සුන්ට කියන්න කිවුවා ඒක අස්කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපි එදා ගිහින් බැලුවා නේද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි බැලුවේ සභාපතිතුමා රෝහල මෙහා පැත්තේ ඉදිකරපු කාණුව ගැන. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරීන්ගේ ඇඟ පුරාම මොළය තියෙන්නේ. ජලය බැස යාමේ කිසිම වැඩපිළිවෙලක් නෑ. ඒක හින්දා ඒ විදියට කාණු

ඉදිකරන්න දෙන්න එපා. අපේ තාක්ෂණ නිලධාරීන් වැඩේ කරන්න බැරිනම් බෑ කියලා කියනවා. දැන් මේකේ ගිහින් බලන්න වතුර රැඳිලා. ඒ කාණු ඉදිකරපු ගෙවල් ටිකේ පහළොස් දෙනෙක් විතර ඉන්නවා රෝහලේ. ඒ හින්දා මේවාට ක්‍රමවේදයක් හදන්න ඕන. කඩොලාන පරිසරය ගොඩකරන්න දෙන්න බෑ. ඩෙංගු වලට විසඳුමක් අපි වෙන මට්ටමකින් හොයමු. මේකේ ජලය බැස යාමේ ක්‍රමවේදයක් සාදන තුරු කඩොලාන ප්‍රදේශය ගොඩකරන්න දෙන්න එපා. ඒකට අනුමැතිය දෙන්නත් එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- පස් දාපු ගමන් කඩොලාන ගස් මැරෙනවානේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** :- සම්බන්ධිකරණ කමිටුවේදී ඒක ගැන කතා කරා. සභාපතිතුමාත්, උප සභාපතිතුමාත්, එදා සම්බන්ධීකරණ කමිටුවේ හිටියා. එතනදී ඉදි කරන රෝහලේ පරිශ්‍රය ඇතුලේ ඩෙංගු නෑ කියලා තමයි කිවුවේ. ඒ ගැන පොඩ්ඩක් හොයලා බලන්න. ජස්ටින් කන්දේ ඉඳගෙන එන වතුර පාර මනම්පේරි අවමංගල්‍ය ශාලාව අසල කාණුවෙන් බැසගෙන ගියේ. ඒ කාණුව ඉතාම පුළුල්ව තිබුණා. දැන් තියෙන්නේ ඉතාම පටු කාණුවක්. කරාපිටියේ කොමර්ෂල් බැංකුව ගාව නිතරම ජලයෙන් යටවෙනවා. ඒකට හේතුව තමයි ඒ කාණුව පටු වීම. ඉඩම්වල අය අල්ලගෙන තියෙනවා ඒ කාණුව. ඒ ගැන විධිමත් ක්‍රියාමාර්ගයක් ගන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** :- 06. කරාපිටිය බෝගහවේල්ල මාර්ගයේ ගොඩකන්ද කොටසින් ආරම්භ වන ස්ථානයේ පැති කාණුව ඉදිකිරීමට යෝජනා කරමි.

ඒ මාර්ගයේ ජලය බැස යාමේ ක්‍රමවේදයක් තිබුණේ නෑ පසුගිය වකවානුව තුල. ඒ මාර්ගයේ කාණු කපලා මම ජලය බැස යාමේ ක්‍රමවේදයක් හැදුවා. ඒ ක්‍රමවේදය හදද්දි නිවාස කීපයක තාප්ප වලට හානි වෙලා තාප්ප කඩා වැටීමේ තත්ත්වයකට පත් වෙලා තියෙනවා. තාප්ප අනාරක්ෂිත තත්ත්වයකට පත් වෙලා තියෙනවා. ජලය බැස යාමේ ක්‍රමවේදයක් නැති නිසා ඒ දේ මම ඒ වෙලාවේ කරා. ඒ නිසා කාණුව ඉදිකිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** :- මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** :- ඒ ගමන්ම ඒ ප්‍රශ්නය ගැන අදහසක් පළ කරන්නම්. ගොඩකන්ද ප්‍රදේශයේ දාපු ඒ යෝජනාවට අදාළ කාණුව දැන් ටික ටික කැඩී කැඩී යනවා. එතනට මෙහා පැත්තේ තියෙනවා වැරැල්ලාන වත්ත පාර. ඒ වැරැල්ලාන වත්ත පාරේ කාණුව කැඩි කැඩී ගිහින් දැන් කොන්ක්‍රීට් පාර කිට්ටුවටම ඇවිල්ලා. අපේ ගෙවල් තියෙන තැනින් වාහනයක් ගන්න බෑ කොන්ක්‍රීට් එක අයිනෙන්. පොඩ්ඩක් එහාට මෙහාට වුනොත් කාණුවට වැටෙනවා. බොහොම අවදානම් තත්ත්වයක් තියෙන්නේ. මම යෝජනාවක් කරා ඒ කාණුව හදන්න කියලා සභාවට මාස හයකට විතර කලින්. ඒකත් කඩිනම් අවශ්‍යතාවයක් සේ සලකා ක්‍රියා කරොත් හරි. නැත්නම් ටික දවසක් යනකොට කාණුව කැඩි කැඩී ගිහිල්ලා පාරත් ගිලා බැසීමේ තත්ත්වයකට පත් වෙනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා** :- ගයාන් ගීතික මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ ගොඩකන්ද ප්‍රදේශයේ ඉදිවෙන තිලක් අබේරත්න මහතාගේ නිවසට ජලය ලබා ගැනීමේ ගැටලුව පිළිබඳ මම සභා වාර්තාව කියෙව්වාට පස්සේ හොයලා බැලුවා. නිවාස සැලසුම අනුමත කර ගෙන තියෙනවා තට්ටු දෙකකට. ඒ සැලසුම දීලා තමයි වතුර අරගෙන තියෙන්නේ. ඒ නිවාස සැලසුමේ පිත්තුරත් ගහගෙන ආවා මම. ඒ වතුර ලබා දීපු එක ගැන වගකීමක් මට ගන්න බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- ඒ ප්‍රශ්නය ගැන අපි ප්‍රගතිය වෙලාවේදී කතා කරමු.

<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** :- ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීවරුනි, ලේකම්තුමා ඇතුළු සියලුම දෙනාටම සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

07. ගනේගොඩ බැද්දදෙණිය දක්වා වූ මාර්ගය තාර දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** :- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** 08. රජයේ සංවර්ධන කටයුතු වලදී ග්‍රාම සංවර්ධන කටයුතුවලදී ග්‍රාම සංවර්ධන සමිති සඳහා කොන්ත්‍රාත් ලබා දීමේදී හැකියා සහතිකය ලබා දීමට සමිති ගිණුමේ තිබිය යුතු අවම මුදල රු.25,000.00 දක්වා අඩු කරන ලෙස යෝජනාවක් සම්මත කර එම යෝජනාව ගරු පාර්ලිමේන්තුවට සහ ගරු දකුණු පළාත් සභාවට යොමු කරන ලෙස යෝජනා කරමි.

පළාත් සභාව නම් කවදා තියාවිද දන්නේ නෑ ඡන්ද නොතියන ආණ්ඩුවක් තියෙන නිසා. පළාත් සභාව රැස්වුන වෙලාවක මේ යෝජනාව යවන්න කියලා ඉල්ලීමක් කරනවා. දැනට රුපියල් එක් ලක්ෂ හැට දහසක මුදලක් තියෙන්න ඕනේ ග්‍රාම සංවර්ධන සමිතිවල. මෙච්චර කල් ග්‍රාම සංවර්ධන සමිති හරහා සංවර්ධන කටයුතු කරනකොට සමිතියේ මුදල් ගන්නේ නෑ. සමිතිය මැදිහත්කරුවෙකු විදියට තමයි මේ කටයුත්ත කරන්නේ. රුපියල් විසි පන්දහසක පමණ මුදලක් සමිති ගිණුමේ තිබුණහම ඇති කියලා තමයි මට හිතෙන්නේ. මොකද රුපියල් එක්ලක්ෂ හැට දහසක මුදලක් තිබුණට ඒ මුදල අරගන්නේ නෑ. කොන්ත්‍රාත්කරු හරහා තමයි ඒ වැඩ කටයුතු ටික සිදු කරන්නේ. සමිති වලට මුදලක් උපයගන්න තියෙන අවස්ථාවක් මේක. සල්ලි තියෙන සමිති විතරක් මේ අවස්ථාව උදාකර ගන්නවා. මම සම්බන්ධීකරණ කමිටුවටත් ලිඛිතව දැනුම් දුන්නා මේ කටයුත්ත ගැන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ප්‍රදේශයේ වැඩිහිටි සමිතිත් ඒකට එකතු කරන්න. එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** සුභ අලුත් අවුරුද්දක් වේවා සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, කාර්ය මණ්ඩලයටත්.

09. මොල්ලිගොඩ වත්ත, ක්‍රසන්ට්, වක්වැල්ල පාර කොන්ක්‍රීට් කිරීම සඳහා යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** ඃ- මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමාටත්, උප සභාපතිතුමාටත්, මන්ත්‍රී මණ්ඩලයටත්, කාර්ය මණ්ඩලයටත් ලබන්නා වූ අවුරුද්ද සුභ අලුත් අවුරුද්දක් වේවායි කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ගරු සභාපතිතුමා, මේ පාර මම ගම්පෙරලිය වැඩසටහනේ යෝජනා වලට දාලා තිබුණා. මේ වෙනකොට මේ පාර හදන්න මුදල් ඇවිල්ලා. ගිවිසුමත් අත්සන් කරලා ඉවරයි. අවුරුදු කාලය නිසා කරන්න හම්බ වුනේ නෑ. අවුරුද්දෙන් පස්සේ මේ පාර මුලින්ම හදන්න තමයි මගේ වැඩසටහන දියත් කරලා තියෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- බොහොම ස්තුතියි.

<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි කණ්ඩායමක් විදියට තීන්දු කරලා තියෙනවා මේ කමිටුවල වාර්තාවල් සඳහා විරුද්ධව ඡන්දය භාවිතා කරනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එහෙම නම් ඡන්දයකට යන්න වෙනවා.

<u>01. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- I. 2019-03-26 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 14

විපක්ෂව - 07

**2019-03-26 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
09. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
13. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
14. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**2019-03-26 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-03-26 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද 07 කින් සභා සම්මත විය.

II. 2019-04-05 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 11

විපක්ෂව - 07

ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 03

**2019-04-05 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා

04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා

**2019-04-05 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**2019-04-05 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
02. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-04-05 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද 04 කින් සභා සම්මත විය.

**<u>02. කර්මාන්ත හා සේවා කමිටුව</u> ඃ-** නැත

**<u>03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව</u> ඃ-** නැත

**<u>04. පරිසර කමිටුව</u> ඃ-** නැත

**(උ෧) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**<u>01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019 වර්ෂයේ මාර්තු මස මාසික ලැබීම් විශ්ලේෂණය (ප්‍රා.ස.6)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019 වර්ෂයේ මාර්තු මස ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019 වර්ෂයේ පෙබරවාරි මස හා මාර්තු මස සංසන්දනාත්මක මාසික ලැබීම් විශ්ලේෂණය

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>04. වෙනත් ලේඛන</u>

<u>I. ප්‍රගතිය</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019 වර්ෂයේ අප්‍රේල් මස මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද ප්‍රගතිය

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, දැන් ඔබතුමා ඉතාම පැහැදිලිව කිවුවා අපිට මේක දිගින් දිගටම කියලා එපා වෙලා තියෙන්නේ. මේ ප්‍රගති වාර්තාවක් දීලා තියෙනවා අපිට නම් මේක නොදුන්නට කමක් නෑ. පාරක් හැදුවහම ඒක හැදුවා කියලා අපි දන්නවා. ඒක හින්දා අපිට මේක වැඩක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමාට මම දැනුවත් වෙන්න දෙයක් කියන්නම්. දහනායක හාඩ්වෙයාර් එකේ අනවසර ඉදිකිරීම පිළිබඳ නඩු දාන්න සැලසුම් කමිටුව තීරණය කරලා තියෙනවා. ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ආයතනයේ අනවසර ඉදිකිරීම් පිළිබඳ නඩු දාන්නත් සැලසුම් කමිටුව තීරණය කරලා තියෙනවා. ඒ ඔබතුමා දිගින් දිගටම කතා කරන ප්‍රධාන අනවසර ඉදිකිරීම් දෙකක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විශේෂයෙන්ම එකක් තියෙනවා මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙන්න ඕන අපේ මාධ්‍යවේදිනියට වෙල මැද්දේ තනිවෙලා වගේ එතුමිය විතරයි මේකට එන්නේ. කරුණාකරලා අනෙක් මාධ්‍ය සහෘදයන්ටත් මේකට සහභාගි වෙන්න කියලා ආරාධනා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- පැතුම් උයනේ ආරම්භක ස්ථානයේ කාණුවටත් නඩු දාන්න භාර දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මේ කිවුවේ ඔබතුමන්ලා අපි එක තැනක ඉඳගෙන සටන් කරන්න ඕන දෙයක් මේ තියෙන්නේ. සභාවක් නොතිබුණ විශේෂ කොමසාරිස් පාලනය තිබුණ කාලේ අපි එකට ඉඳගෙන සටන් කරේ. පහුගිය සභාවක මම සභාගත කරපු ලේඛන විසිපහ දැක්කම ඒක දන්නවා. අපි බොහොම ලෙන්ගතුව ඒ සටන් ගෙනිච්චා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමා හරියටම හරි. නිවැරදියි. නමුත් ඔබතුමා එක්ක එකඟ නොවුන කාරණා තිබුණා. උප සභාපතිතුමාගේ පස් කණ්ඩියක් කැපීමේ ප්‍රශ්නයේදී ඔබතුමා හිටපු තැන නෙමෙයි මම හිටියේ. බිලු මවුන්ටන් වෙන්දේසි ඉඩම, ඇක්සස් වෙන්දේසි ඉඩම සම්බන්ධ සියලු ඒවාට මම විරුද්ධයි. අද වුනත් එහෙමයි. සභාපති වුණා කියලා නෑ ඔබතුමාගේ මතය දරන අවස්ථා තියෙනවා. මම කියලා ඇති මේවාට මම එකඟයි කියලා. අදටත් වතුර ටැංකිය පාරේ පල්ලමේ තරංගා ලැන්ඩ්ස් වෙන්දේසි කරපු ඉඩමට මම විරුද්ධයි. ඔබතුමා ඕන පර්යේෂණයක් ඉල්ලන්න. මම සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. ඒ වගේම තමයි අපි සටන් කරපු ඕනම වෙන්දේසි ඉඩමක් සම්බන්ධයෙන් අදටත් ඒ මතයේ මම ඉන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා දැන් මේක සියපාරට විතර කියන්නේ. දැන් වෙලා තියෙන්නේ අපි එහෙම නොකරපු එක. වතුර ප්‍රශ්නය ගන්නකෝ. වතුර ප්‍රශ්නයේදී අපි ඉතාම පැහැදිලිව ගත්තා තීන්දුවක්. ජල සම්පාදන මණ්ඩලය වටලන්න යනවා කියලා. ඒක වුණේ නෑ. ඒක බොහොම වැදගත් දෙයක්. දැන් කරත් කමක් නෑ. ඒක අමතක කරන්න එපා. ඔක වටලන්න ඔබතුමා අපිට කියන්නේ කවදද කියලා අපි බලන් ඉන්නවා. වෙන දෙයක් නෙමෙයි මේකේ තියෙන්නේ. අද බොහොම පැහැදිලිවම මුදල් වලට තමයි ජල සම්බන්ධතාවය ලබා දෙන්නේ. මම ඉල්ලලා යවලා තියෙනවා මොනවද වතුර ලබා දෙන්න අවශ්‍ය නිර්ණායකයන් කියලා. ජල සම්පාදන

මණ්ඩලයට ගියාම කියනවා හදා ගෙන යන ගෙවල් වලට නම් වතුර දෙන්න බෑ කියලා. දැන් තිලක් අබේරත්න මහතාගේ ඉදිකිරීමට අදාළ සැලසුම අනුමත කරලා ඇති. නමුත් අනුමත කරපු සැලසුමට නෙමෙයි ඒ ඉදිකිරීම කරේ. ඒක නිකං ගිහින් බලන්න. එතන කාණුව මුලින් තියෙනවා අඩි දෙකක් විතර පළලට. ඇතට යනකොට තුන්හුලස් වගේ පටු වෙලා. දැන් තුන්වෙනි තට්ටුවත් ඉදිකරනවා. තට්ටු දෙකටයි අනුමත කරලා තියෙන්නේ. දැන් තුන්වෙනි තට්ටුවේ වැඩ යන්නේ. මම අහන්නේ කොහොමද වතුර ලබා දුන්නේ. හදාගෙන යන ගෙවල්වලට වතුර දෙන්නේ නැත්නම් කොහොමද ඒ ඉදිකිරීමට වතුර ලබා දුන්නේ. ඒක ව්‍යාපාරයක්නේ. අහිංසක මිනිස්සුන්ගේ ගෙවල් වලට වතුර ලබා දෙන්නේ නෑ. මේ ප්‍රදේශයේ තියෙන වතුර ටික අපිට නැත්නම් වැඩක් නෑ. ගමේ කජු පුහුලම් ටික ගමේ වවුලන්ට කන්න තියෙන්න ඕන. ඒක නැති තත්ත්වයක් තමයි උදා වෙලා තියෙන්නේ.

ඊළඟට අනවසර ඉදිකිරීම් පිළිබඳව සභාපතිතුමා කියපු කීපයට නඩු දාන්න තීරණය කරපු එක බොහොම හොඳයි. මගේ ඉල්ලීම තමයි ඕනම අනවසර ඉදිකිරීමකට නඩු දාන්න. හැබැයි සියල්ලටම ප්‍රථමයෙන් නඩු දාන්න ඕන ප්‍රධාන ලොකු මිනිස්සු කරපු අනවසර ඉදිකිරීම් වලට. අහිංසක මිනිස්සුන්ගේ යන්තම් අටවා ගනිපු ගෙදරකට නඩු දානවට වැඩිය දාන්න ඕනේ ප්‍රධාන අනවසර ඉදිකිරීම් වලට. නම් වශයෙන් මම ලබා දීලා තියෙනවා. ඒවාට නඩු දාලා ඊට පස්සේ ඕන එකකට නඩු දාන්න. කිසි ප්‍රශ්නයක් නෑ.

ඊළඟට අපි ඉල්ලුවා ප්‍රගතිය විදියට තාක්ෂණ නිලධාරි මහත්වරුන්ගේ බලප්‍රදේශවල අනවසර ඉදිකිරීම් ගැටලු සම්බන්ධව. අද වෙනකොට කීයක් ගෙනත් තියෙනවාද කියලා අපි කාරක සභාවක් කරලා හරි අහමු. දැන් ඔබතුමා මේ ප්‍රාදේශිය සභාවේ ලොක්කා. කොච්චර නඩු ගෙනත් තියෙනවාද කියලා බලන්න ඕන.

මේ තමයි අපි ඉතාම පැහැදිලිව තීන්දුවක් ගත යුතු තැන. විරුද්ධ වෙන තැන්වල විරුද්ධ වෙන්න කිසි ප්‍රශ්නයක් නෑ. අපි ගේන දේ හරිනැත්නම් විරුද්ධ වෙන්න කිසි ප්‍රශ්නයක් නෑ. ඉතාම පැහැදිලිව මේ ටොරින්ටන් ටෙරස් එකේ තියෙන ඉඩම බලන්න. තාක්ෂණික දැනුමක් ඕන නෑ. කොහොමද ඒක අනුමත කරන්නේ. කොහොමද ඒකේ ගෙයක් හදන්නේ. අපිට තේරෙන්නේ නෑ. මාධ්‍යවේදීන්ට මම කියනවා යන්න කරුණාකරලා ඒවා බලන්න. මේ මිනී මරන්න හදන්නේ. පෙනි පෙනී මිනී මරන්න හදන්නේ. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට දොස් කියනවා නෙමෙයි. ඔබතුමාලා අපි මහජන නියෝජිතයෝ. මේ ප්‍රශ්න එකක්වත් එන්නේ නෑ මේ තාක්ෂණ නිළධාරීන් එන්.බී.ආර්.ඕ එක, යූ.ඩී එක, මධ්‍යම පරිසර අධිකාරිය තමුන්ගේ තීන්දු තීරණ නිවැරදිව දෙනවානම්. ගරු සභාපතිතුමා මේකට ගැටෙන්න ඕන නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක ඔබතුමා දන්නවා. මම මාස හතරක් කමිටුවට දාලත් අනුමැතිය නොදී හිටියා. ඒකට අනුමැතිය නොදී සිටියානම් අපිට විරුද්ධව නඩු කියනවා. ගත යුතු වාර්තා අනුව අපිට ප්‍රමාද කරන්න පුළුවන්. උපරිම කාලයක් මම ඒක ප්‍රමාද කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඔබතුමාට වැඩක් කියන්නම්. ඔබතුමයි මමයි මේ මතය දැරුවා. බොහොම පැහැදිලිව දැරුවා. එන්.බී.ආර්.ඕ එක, යූ.ඩී එක කොහේ තිබුණත් මේක අපේ ප්‍රදේශය. ඔබතුමත්, මමත් දෙන්නම ඒ මතය දැරුවා. ඒ කාලේ අපි කිවුවා පත්මසේන සභාපතිතුමාට, මාදුගොඩ සභාපතිතුමාට, සභාපති චන්දිම හාමුදුරුවන්ට ඔබතුමාලා ඒක අත්සන් කරේ නැත්නම් අනුමැතිය දෙන්න බෑ කියලා. අනිත් එක උසාවි යනවා නම් යන්නේ වැරැද්දක් කරලා නෙමෙයිනේ. හොරකම් කරලා නෙමෙයිනේ යන්නේ. වැරදිනම් බොහොම පැහැදැලිව විරුද්ධ වෙන්න. අපි ඔබතුමත් එක්ක ඉන්නවා. ඔබතුමා දුරකථන සම්ප්‍රේෂණ කුළුණකට තනියම නඩු කිව්වා. ඒකට අපේ ආශිර්වාදය තිබුණා. අපි අදටත් සන්තෝෂ වෙනවා ඒ ගැන.

ඊළඟට බලන්න අපි පෙන්නුවා කොයිතරම් නම් වැරදිද කියලා පැතුම් උයනේ සිලින්ඩර් ප්‍රශ්නය. සිලින්ඩර් දානකොටම අපි කිවුවා මේ සිලින්ඩර් දාන්න එපා කියලා. දැනටම ඒවා කැඩිලා ගිහිල්ලා. ඔබතුමන්ලා ගියානේ ඒක බලන්න. මාස හයක් වුනේ නෑ. එකේ තීරණ ගනිපු මිනිස්සු ලැජ්ජ වෙන්න ඕන. විලිලැජ්ජාව නැති ටික දෙනෙක් ඉන්නවා ඒකේ. ස්තුති කරලා ලියුම් එවුවා. මම නම් කරලම කියනවා. මොකක්ද එයාට තියෙන අයිතිය ස්තුති කරලා මේවා දෙන්න.

ගරු සභාපතිතුමනි, ඊළඟට ඔබතුමාට කියනවා බොහොම පැහැදිලිව යූ. ඩී. ක්ලියරන්ස් දෙන කොට බොහොම පැහැදිලිව එකේ වාක්‍යයක් දාලා තියෙනවා මොනම හේතුවක් නිසාවත් ඉඩම් කැබලි විකුණන්න එපා සී. එෆ්. සී. එක දෙනකම් කියලා. නමුත් බැනර් දාලා විකුණලා ඉවරයි. දිගටම මේක වෙනවා. අද තීන්දුවක් ගන්න. එහෙම කරන ආයතනවලට මොකද කරන්නේ කියලා. අද එකතු වෙලා ගන්න තීන්දුවක්. මේක මෙහෙම යන්න ගියොත් සභාවක් නැති වෙනවා සභාපතිතුමනි,

කපුහෙම්පල ප්‍රදේශයේ ගිහින් බලන්න ඔබතුමන්ලා නල ළිඳක් හදලා තියෙනවා. නල ළිඳ පාරේ හදලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපි ඒ බැනර් කැපුවනේ අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ආයේ ඒ බැනර් දාලා.

කරුණාකරලා මේ නිලධාරීන්ට කියනවා උදාහරණයක් තමයි ඇක්සස් වෙන්දේසි ඉඩම. ඔබතුමාලා ඒකට සම්බන්ධ නෑ. ඒ කාලේ වෙනකොට හදලා ඉවරයි. කොහොමද ඒකේ අර කාණු දැම්මේ. ඒ කාණු වලින් වතුර බහින්න පුළුවන්ද?. දැන් මේකේ කාණු දාලා තියෙන්නේ එහෙම. කපුහෙම්පල, හිරිඹුරේ වෙන්දේසි ඉඩම්වල දාපු කාණු ගැනනම් කතා කරන්නම දෙයක් නෑ. හරිවිදියට කරලා දෙනවා නම් අපිට ප්‍රශ්නයක් නෑ. කාණු හදලා ඉවර වෙනකොටම කාණු ගොඩවෙලා කාණු කැඩෙනවා. දැන් කොහොමද ඒකේ පස් කපන්නේ. පස් කණ්ඩියක් තියෙනවා ඉඩමට ඇතුල්වෙන තැන. එතකොට වතුර බැහැලා යන්නේ කොහොමද?. පහත් බිම් ගොඩකිරීමේ මණ්ඩලයෙන් ඒ ඉඩමට ඇවිල්ලා කොහොමද වතුර බහින්නේ කියලා බලනවා. එයාලට දෙන්න ඕන ඩිසයින් එකක්. අවසරය දෙනවා සල්ලි ටික ගන්නවා. දුන්නට පස්සේ උන් ඒක අරගෙන තියෙනවා කියලා ගොඩකරනවා. දැන් මේ එන්.බී.ආර්.ඕ එක කරන වැඩ තියෙනවා. සම්බන්ධීකරණ කමිටුවේදී ඇහුවහම කියනවා අවසර දීලා තියෙනවා කියලා. මොකක්ද දීලා තියෙන්නේ. මධ්‍ය අවදානම් කියලා. ඒ විතරක් නෙමෙයි මේ තක්කඩි ආයතන එන්.බී.ආර්.ඕ එකයි, යූ.ඩී එකයි, ඔබතුමා බලන්න අපි දිගටම හැප්පුන ඒවා ඒ. ඔබතුමා අදත් ඉන්නවා ඒ ස්ථාවරේ.

රොස්වුඩ් එකේ වෙන්දේසි ඉඩම සම්බන්ධව මම යම් යම් කාරණා ඉල්ලනවා තොරතුරු පනත යටතේ. මම අහනවා අක්කර කීයක් තියෙනවාද කියලා. මූලික සැලසුම් නිරාකරණය දීලා තියේද කියලා අහනවා. ඒකේ පහළ තියෙනවා බැලූ බැල්මට කුඹුරක්. කුඹුරක් නෙමෙයි නම් ඒක පහත් බිමක්. ඒක ගොඩ කරලා. ඒකට දීපු උත්තරය තමයි මූලික සැලසුම් නිරාකරණය ලබා දීමේදී ඉඩමේ පහළ කොටස කුඹුරු ඉඩමක් හෝ වගුරු ඉඩමක් ලෙස සඳහන් කර නොමැති බැවින් පහත් බිම් ගොඩකිරීමේ මණ්ඩලයෙන් අනුමැතියක් ලබා ගැනීමට දන්වා නොමැත. ඒ කියන්නේ මේ ඉඩම බලන්නවත් ගිහින් නෙමෙයි මේ අවසර දෙන්නේ. ඒ මූලික සැලසුම් දෙන්නේ ඉඩම බලන්න ගිහින් නෙමෙයි. පැතුම් උයන මුල් කොටසට දෙන කොට ඒකේ තියෙනවා යෝනක කුඹුර කියලා. ඒකට දෙනවා. මොවුන්ගේ පරස්පරතාවය ජේනවා නේද?. මේක තමයි ඇත්ත. ඊළඟට මගේ පස්වෙනි ප්‍රශ්නයට කියනවා මධ්‍යම පරිසර අධිකාරියෙන් නිර්දේශ ලබා ගන්නා ලෙස මූලික සැලසුම් නිරාකරණ ලබා දී නොමැත කියලා. මූලික සැලසුම් නිරාකරණ ලබාදෙන්නේ යූ.ඩී එකෙන්, සභාව නෙමෙයි ඒක ලබා දෙන්නේ. ඒක දීලා නැති නිසා අරගෙන නැහැලු. මේ රොස්වුඩ් වෙන්දේසි ඉඩමට මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසර ගන්න ඕන. නැත්නම් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කිසිම ඉඩමකට අවසර ගන්න ඕන නෑ මධ්‍යම පරිසර අධිකාරියෙන්. පරිසරයට හානි කරපු පරිසරය කපලා කොටලා විනාශ කරපු තැනක් මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමා ඒකට දිගින් දිගට කතා කරන්න ඕන නෑ. පරීක්ෂණයක් ඉල්ලලා සභා තීන්දුවක් ගමු. මමත් අත්සන් කරන්නම් ඒකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම මීට පෙරත් ඒකට යෝජනා කරා. කරුණාකරලා මේක පිළිබඳවයි, මේ කියපු මූලික වෙන්දේසි ඉඩම් තුනට පරීක්ෂණයක් කරන්න.

මීට අමතරව ඔබතුමන්ලා අපි සාකච්ඡා කරපු අනෙකුත් වෙන්දේසි ඉඩම්වලටත් පරීක්ෂණයක් කරන්න මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් පරීක්ෂණයක් කරා. පරීක්ෂණයක් කරලා බොහොම පැහැදිලිව කිව්වා පොදු පහසුකම් වලට දීලා තියෙන ගල් කුලක්. මේවට ගන්න ඕන තැන් කිව්වා. ඒවා ගන්නේ නෑ. දැන් හරි සභාපතිතුමා ඒවා ලබා ගන්න සටන් කරන්න. අපි ඉන්නවා ඔබතුමා එක්ක.

ඊළඟට අපි බොහොම පැහැදිලිව කිව්වා මේ ගේන යෝජනාවල් ගැන. මේක සම්ප්‍රදායක්. කරපු දෙයක්. හරි දේ. දුරකථන සම්ප්‍රේෂණ කුළුණු වලින් අපිට ආදායමක් ගන්න විදිය කිව්වා. ඒක ඒ

ආයතන වලට දැනුම් දුන්නම අදාල මන්ත්‍රීවරයාටත් එකේ පිටපතක් යවන්න ඒකේ. එහෙම දැන්වූවා කියලා අපිට කියනවා. හැබැයි එහෙම ලියුම් යවන්නේ නෑ. එහෙම වුන ඒවා දන්නවානේ ඔබතුමත් දන්න. අපිට ඒ ලියුමේ පිටපතක් ආවා නම් අපි විමසලා බලනවා ඒක කරාද කියලා. ඒ නිසා ඒ දේ කරන්න. මේ වෙනකම් ඒ දේ කෙරුණේ නෑ.

දැන් ඔබතුමාලා අපි ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ආයතනයේ අනවසර ඉදිකිරීම් සම්බන්ධව යෝජනා ගෙනාවා. කරුණාකරලා ඒ නඩු පරාද වෙන්න නම් දාන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඒ නඩු සම්බන්ධව විස්තර ලබා දෙන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- මේ පොලීසියේ හැසිරීම ගැන කියන්න ඕන. මම නෛතික වටිනාකමක් තියෙන නිසා සභාවේදී කතා කරන්නේ. නැත්නම් වෙන මුකුත් නිසා නෙමෙයි. ඉඩමක් ගොඩ කරන්න ඕන නම් උපදෙස් ගන්න ඕන මේ පොලීසියේ ස්ථානාධිපතිතුමාගෙන්. මගේ ලඟ ඒකට සාක්ෂි තියෙනවා. කැමරාවේ වීඩියෝ උන ඒවා තියෙනවා ගොඩ කරන තැන බලාගෙන ඉන්නවා. ඒක තමයි පෝද්දල පොලීසියේ ස්ථානාධිපතිගේ තත්වය. පොලීසියේ පහළ නිලධාරීන් ඒකට සම්බන්ධ නෑ. පහළ නිලධාරීන් අසරණ වෙලා ඉන්නේ. අර ඊරියගහ හන්දියේ සංවර්ධනය කරපු ඉඩමේ සම්පූර්ණයෙන් පස් ටික පෝද්දල පොලීසියේ ස්ථානාධිපති කියන තැන් වලට තමයි ගිහිං දැම්මේ. එයා කියන තැන් වලට ගිහිං දැම්මම රුපියල් තුන්සියයක්ද රුපියල් හාරසියයක්ද කොහෙද දෙන්නේ. පස්වලට සල්ලි ගන්නේ එයා. මේක තමයි පොලීසියේ මහත්වරුන්ගේ ඇත්ත තත්වය. මේක මෙහෙම තියාගෙන සාධාරණයක් වෙනවද. මේ නිසා සභාපතිතුමනි එතුමාගෙන් ඇහුවම කිව්වේ මම ඒක පහත් බිම් ගොඩ කිරීමේ මණ්ඩලයට දැම්මා කියලා. ඒක අපේ රාජකාරියක්. පහත් බිම් ගොඩකිරීමේ මණ්ඩලයට දාන එක පොලීසියේ ස්ථානාධිපතිගේ රාජකාරියක් නෙමෙයි. ඒක ප්‍රාදේශිය සභාවේ රාජකාරියක්. ඒ හින්දා මේ දේවල් පිළිබඳව අවධානය යොමු කරලා අලුත් අවුරුද්දේ අපි හොඳ වැඩ පිළිවෙලකට යමු කියන යෝජනාව කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** :- අනිල් බන්දුතිලක මන්ත්‍රීතුමාට අසනීප තත්ත්වයේ පසුවන නිසා අද සභා රැස්වීමට සහභාගිවීමට හැකියාවක් ලැබෙන්නේ නෑ. එතුමාට නිවාඩු අනුමත කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** :- අනවසර ඉදිකිරීමක් ගැන මම ගිය සභාවේදී කතා කරා. ඒකට නඩු දානවා කිව්වා. ඒකේ තත්වය කොහොමද දන්නේ නෑ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- තාක්ෂණ නිලධාරීන් අනිවාර්යයෙන් සභා රැස්වීමට පැමිණෙන්න ඕන.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** :- ඒක සම්පූර්ණයෙන් ඉදිකරලත් ඉවරයි. ඔබතුමා ඒක ගිහින් තහනම් කරත් ඉදිකිරීම් කටයුතු සිදු කරලා ඉවරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඉදිකිරීම කරාට නඩු දාන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** :- තව දෙයක් දැනගන්න ඕන. සම්බන්ධීකරණ කමිටුවේදී පෝද්දල පොලීසියේ ස්ථානාධිපතිතුමයි, අක්මීමණ පොලීසියේ ස්ථානාධිපතිතුමයි මුණ ගැහෙන්න ලැබුණා කාලේකින්. එතනදි මත්ද්‍රව්‍ය උවදුර ගැන ගොඩක් විස්තර මම ඒ අයගෙන් ඇහුවා. මම අක්මීමණ පොලීසියේ ස්ථානාධිපතිතුමාගෙන් ඇහුවා අර ලබුදූවේ ළමයෙක් අත්අඩංගුවට ගත්තම උදුල මන්ත්‍රීතුමාට කතා කරලා නිදහස් කරන්න කියලා කිව්වද කියලා. එතකොට ස්ථානාධිපතිතුමා දුන්න පිළිතුර තමයි මම එහෙම දෙයක් කිව්වේ නෑ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඒක ගැන මෙතන කතා කරලා තේරුමක් නෑ මන්ත්‍රීතුමා. ඒක පොලීසියේදී මතු කරන්න ඕන කාරණයක්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** :- ඒ ගැන කාංචනා මන්ත්‍රීතුමිය අදහසක් දක්වනවා නම් හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එතුමිය අදහස් දැක්වූවා කියලා එතනින් එහාට දෙයක් නෑ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ඩෙංගු උවදුර විශාල වශයෙන් ව්‍යාප්ත වෙලා තියෙනවා. සභාවක් හැටියට අපේ මැදිහත්වීම මදි කමක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මැදිහත්වීම මදිනම් මොකද කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ජස්ටින් කන්ද, කරාපිටිය ප්‍රදේශවල දැනටමත් හතලහක විතර ඩෙංගු රෝගීන් ප්‍රමාණයක් ඉන්නවා. එම නිසා මම ඉදිරි දවස් කීපයක් ඇතුලත ශ්‍රමදානයක් ලැහැස්ති කරනවා ගමේ පිරිසත්, සභාවත් සියලු දෙනා සම්බන්ධ වෙලා. මම දිනය කියන්නම්. මට ජේ.සී.බී යන්ත්‍රයක්, සභාවේ සියලුම කම්කරුවෝ ටික ලබා දෙන්න. සෞඛ්‍ය මධ්‍යස්ථානය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් සම්බන්ධ කරගන්නවා. ඒ කඩොලාන ප්‍රදේශයට තාවකාලික හරි විසඳුමක් සකස් කරන්න. ඒ හින්දා සභාවෙන් ජේ.සී.බී යන්ත්‍රයක්, සභාවේ සියලුම කම්කරුවෝ ටික සහ ජල බවුසරයකුත් එදිනට ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ජේ.සී.බී යන්ත්‍රයක් නැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කුලී පදනම මත අරගෙන ජේ.සී.බී යන්ත්‍රයක් හෝ එක්ස්කැවේටර් යන්ත්‍රයක් ලබා දෙන්න. ඒ දිනය නම් කරාම සභාවෙන් අත්‍යවශය කටයුත්තක් සේ සලකලා ක්‍රියා කරන්න කියලා මම යෝජනා කරනවා. ඒ ප්‍රදේශයේ රෝගීන් හතලිස් දෙනෙකු විතර මේ වෙනකොට ප්‍රතිකාර ලබනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- සුභම සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා සියලු දෙනාටම මම ප්‍රාර්ථනා කරනවා.

පසුගිය දවසක මාගේ කොට්ඨාශයේ පිහිටා ඇති කලේගාන පොලේ තියෙන කඩ කාමර වල කාමර අංක 03 මුළුමනින්ම විනාශ වුනා විදුලි කාන්දුවකින් ගිනි අරගෙන මගේ ඉල්ලීම ඒ මනුස්සයට ඒ කඩේවත් පිළිසකර කරලා දෙන්න කියලා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- ඒ වගේම එස්.ඕ.එස් ළමා ගම්මානයට එහා පැත්තේ අනවසර ඉදිකිරීමක් කරනවා. සභාවට ඒකේ හිමිකරුත් ආවා. තාක්ෂණ නිලධාරීතුමියත් ගිහිං පරීක්ෂා කිරීමක් සිදු කරලත් තිබුණා. ඒ කෙනාට සාධාරණයක් කරලා දෙන්න ඒක අනවසර ඉදිකිරීමක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක ගැන වෙනම කතා කරලා බේර ගමු.

**ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ප්‍රගතිය පිළිබඳ සඳහන් කිරීමේදී මට ගැටලුවක් මතුවෙලා තියෙනවා. ඒ ඒ මාසවල ප්‍රගතියේදී සඳහන් වෙන්නේ ඒ ඒ මාසවල කෙරුණ සංවර්ධන වැඩ කටයුතුද කියලා මම දැන ගන්න කැමතියි. ලබුදූව විජයාරාම පන්සල අසල පාර සංවර්ධනය මේ තුන්වෙනි පාර ප්‍රගතියට සඳහන් වුනේ. මාස හයකට පමණ කලින් කරපු සංවර්ධන කටයුත්තක් ඒක. මේක මගේ ගිණුමට හැමදාම බැරවෙනවා ලබුදූවටම තමයි හැමදාම වැඩ කරන්නේ කියලා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, මම අර වක්වැල්ලේ මීදි කඩේ අසලින් ඇති පාර කොන්ක්‍රීට් කරා බටුවන්තුඩාව පාර ළඟට වෙනකම්. ඒ පාරට නමක් මම යෝජනා කරනවා. යෝජනාවට ගම්වාසීන් කීප දෙනෙකුගෙන් අත්සන් අරගෙන ඉදිරිපත් කරන්න කියලා මාව දැනුවත් කරා. ඒ පාරට මම නම යෝජනා කරන්න ඉන්නේ "නැසීගිය ග්‍රේස් පතිරණ මාවත" කියලා. ඒක මම ලිඛිතව ඉදිරිපත් කරන්නම් අත්සන් ටිකත් එක්කම.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාට සුභ අලුත් අවුරුද්දක් වේවා. ඒ වගේම ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත්

සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මමත් ඒ ප්‍රාර්ථනාව කළ යුතුයි සියලු මන්ත්‍රීවරු වෙනුවෙන්.

කාරණා දෙකක් මතු කරන්න ඕන. එකක් තමයි අබේසේකර මන්ත්‍රීතුමා මතු කරා දිගින් දිගටම අපේ ආදාහනාගාරය ඉදිකිරීම පිළිබඳ ප්‍රශ්නයේදී. පෝද්දල එක මේ වෙනකොට මැනුම් කටයුතු සිදු කරලා තියෙනවා. මම දිගින් දිගටම මැනුම් කටයුතු සිදු කරපු මිනින්දෝරුතුමියට ප්‍රකාශ කරා මේකේ මායිම් කණු ටික දාලා දෙන්න කියලා ඉතුරු වැඩ කටයුතු ටික කරන්න. නමුත් ඒක තාම කෙරුණේ නෑ. ඒක ප්‍රමාද වෙන හේතුව ටිකක් හොයලා බලන්න කියන ඉල්ලීම මම කරනවා.

ඒ වගේම සිට්ටුස් වත්තේ අක්කර පහක ඉඩමක් ලබා ගන්න ලේකම්තුමා ලිපියක් ඉදිරිපත් කරේ නෑ කියලා අබේසේකර මන්ත්‍රීතුමා බොහොම පැහැදිලිව කියද්දි එතුමාට භාරදීලා අබේසේකර මන්ත්‍රීතුමාවත් දැනුවත්ව ඒ ලියුම යැව්වා. මම දැන ගන්න කැමතියි. මොකක්ද ඒ ලියුමට වෙලා තියෙන්නේ. මොකක්ද ඒකේ තත්ත්වය කියලා. මොකද හැම ආකාරයකින්ම යටපත් වෙන්නේ නැතුව ඒ අක්කර පහ ලැබෙනවා නම් එතන අදාහනාගාරය හදන්න කිසි ගැටලුවක් නෑ. ගරු අබේසේකර මන්ත්‍රීතුමනි, ඒ ලියුමට මොකද වුනේ කියලා මම දැන ගන්න කැමතියි. ඒකට පොඩි උත්තරයක් ලබා දෙන්න. මට තව කරුණු තියෙනවා කතා කරන්න ඒ නිසා ඔබතුමාගෙන් උත්තරයක් මම බලාපොරොත්තු වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ලියුම ගරු අමාත්‍යතුමාට ලබාදීලා තියෙනවා. ඒ අවශ්‍ය කටයුතු කරගෙන යනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** කවදා විතර අපිට එකේ උත්තරයක් ලැබේවිද?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම හිතනවා ඒක ඉක්මණට ලැබේවි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපේ පැත්තෙනුත් පළාත් පාලන කොමසාරිස්තුමා හරහා ආණ්ඩුකාරතුමාට යොමු කරලා තියෙනවා ඒ යෝජනාව. ඉස්සෙල්ලා හම්බවෙන ඉඩමේ අදාහනාගාරය ඉදි කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** මෙතුමා සඳහන් කරා කරුණු කාරණා ප්‍රකාශ කිරීමේදී සභාවෙන් ලිපි ගිහින් තියෙනවා. ලැබිලා නෑ කියලා. මම ඒක මීට කලින් මතක් කරා මීපාවල පාර සම්බන්ධව සභාවෙන් ලිපි පහක් ගිහින් තියෙනවා. නමුත් ඒ නිවසට ලැබිලා නෑ. ඒක හොයලා බලන්න කියන ඉල්ලීම කරනවා.

සියලු දෙනාටම ලබන්නා වූ අලුත් අවුරුද්ද නිදුක් නිරෝගී සුවබර නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** සේරියගොඩ පාර අලුත්වැඩියාව සම්බන්ධව සභාපතිතුමා ඇත්තටම ස්තුතිවන්ත වෙන්න ඕන ගම්පෙරළිය වැඩසටහන යටතේ ඒ පාරේ ඉතුරු කොටස කරලා තියෙනවා. නමුත් පොඩි ප්‍රශ්නයක් තියෙන්නේ ෆස්ට් කෝඩ් එකයි, සෙකන්ඩ් කෝඩ් එකයි දෙකම එකට කරලා තියෙනවා. ඒක ගැන හෙයලා බලන්න සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- රංගනී මන්ත්‍රීතුමිය, සේරියගොඩ පාරේ ෆස්ට් කෝඩ් එකයි, සෙකන්ඩ් කෝඩ් එකයි දෙකම එකට කරලා තියෙනවා කියලා චෝදනාවක් තියෙනවා. ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලා සිටිනවා. දවස් දාහතරක් ගිහිං තමයි සෙකන්ඩ් කෝඩ් එක ගහන්න ඕන. මේකේ ෆස්ට් කෝඩ් එකයි, සෙකන්ඩ් කෝඩ් එකයි එක ළඟ දවස් දෙකක කරා කියලා චෝදනාවක් තියෙනවා.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** කලින් දවසේ චිප්ගල් ගහලා ෆස්ට් කෝඩ් එක කරා. දෙවැනි දවසේ සෙකන්ඩ් කෝඩ් එක කරලා වැලි ගහලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපේ තාක්ෂණ නිලධාරීතුමා ඒක අධීක්ෂණය කරන්න.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** ඒක ගැන අනිවාර්යයෙන් හොයලා බලන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ බල ප්‍රදේශය අඩුම තරමේ අපිට රටේ විදියට බැරි නම්, අපේ ප්‍රදේශයේ ළමයින්ට අසාධාරණයක් සිදුවෙලා තියෙනවා.

සිරිධම්ම විද්‍යාලයේදී ඊයේ පෙරේදා හොඳ උත්සවයක් පැවැත්වූවා. සල්ලි තිබුණහම හොඳට වැඩ කරන්න පුළුවන් ඒක හොඳට සකස් කරලා තිබුණා. ඒක බොහොම සාර්ථකව සිදු කරා. හැබැයි කුරුන්ද කන්ද ප්‍රදේශයේ ළමයි හතරක් පහක් ගත්තේ නෑ. අපි අනිත් ඉස්කෝලවල ළමයි අමතක කරලා දාමු. මේ ළමයි පිළිබඳව ඇත්තටම මම දන්නවා නම් ඒක එදා දවසේ, මම කාංචනා මන්ත්‍රීතුමියටත් කිවුවා, අපේ මන්ත්‍රීවරු එක්කත් කිවුවා ඔබතුමා දන්නවා අපේ ගරු අමාත්‍යතුමාත්, විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමත් පන්ති කාමර බලාගෙන එනකොට මේකේ වැඩිහරිය ඉන්නේ මාපලගම අය එහෙම කියලා කිව්වා. මේක කියලා වැඩක් නෑ. මම දන්නවානම් ඒක එදා දවසේ ඒ ළමයි ගෙන්නලා ලග්ගනවා ඒක ඉස්සරහ. ඔබතුමා ලොකු අඩුපාඩුවක් කරේ.

ඒ වගේමයි කවුරු වුණත් පොඩ්ඩක් කතා කරානම් ඒ වැඩේ කරන විදිය කාගෙන්හරි ඉගෙන ගන්න ඕන. අපිට වැරදිච්ච එකක් මම මේ කියන්නේ. මම ඒ වෙලාවේ හිටියේ එක්සත් ජාතික පක්ෂයේ, අපේ නායකතුමා රනිල් වික්‍රමසිංහ මැතිතුමා කටු ඉත්තේ මල් හදලා, ආර්ථිකය හදලා රැකියා දෙන්න ආවා. අනේ දෙයිහාමුදුරුවනේ එදා ඇවිල්ලා මොකද වුනේ. හතලිස් පන්දහසක උපාධිධාරි පිරිසකට රැකියා ලබා දුන්නා. ඊළඟට එකක් තියෙනවා දැන් මෙච්චර කාලයක් වාඩිවෙන්න තැනක් නැතුව ඉඳපු අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගත්තම දවල් 12.00 වෙනකොට නිලධාරීන්ට කන්න තැනක් නෑ. පුටු මේස ටික එකතු කරලා බත් ටික කනවා. දෙයියනේ කියලා අපේ ගරු වජිර අබේවර්ධන ඇමතිතුමා බිල්ඩින් හදලා දීපු නිසා දැන් හොඳට වාඩි වෙලා ඉන්නවා. හැබැයි මේවා ඉගෙන ගන්න ඕන. එදා හතලිස් පන්දහසක පිරිසකට රැකියා දුන්නේ නෑ. ඕවා හද හද ඉන්න ගියා. බලන්න අපේ ආණ්ඩුවෙන් සල්ලි වෙන්කරා. බලන්න පළාත් සභාවෙන් රැකියා කීයක් දුන්නද?. මහ රෑ දුන්නා රැකියා. ඒක හොඳයි. එච්චර ක්‍රියාත්මකයි. රෑ 12.00 වෙනකම් දුන්නා. අපි සන්තෝෂයි. මෙහේ විතරක් නෙමෙයි හැම තැනම දීලා තියෙනවා. ඒක හොඳයි. එහෙම කරන්න ඕන. අපේ මිනිස්සුත් මේ ටික ඉගෙන ගන්න. මේ ටික ඉගෙන ගෙන හරි වැඩ කරන්න. මොකද දන්නවාද දැන් හරි දෙන්න ඕන. ගරු සභාපතිතුමනි, මේ ඉගෙන ගත්ත ළමයි ඇවිල්ලා ඉන්නේ. හැබැයි විගණකාධිපති කාර්යාලයේ ඉන්නේ හයදෙනයි. ඇයි බැරිද මොන ආණ්ඩුවකටවත් ඉගෙන ගත්ත ළමයි ටිකක් විගණකාධිපති එකට දාන්න. දකුණු පළාතෙම විමර්ශනය කරන්න ඉන්නේ හයදෙනයි. බලන් යන්නවත් බෑ. ඉතිං ඇයි මේ ඉගෙන ගනිපු උපාධි තියෙන ළමයි ඒවාට දාන්න බැරි. කරුණාකරලා ඔබතුමාලා මේකට හඬක් නගන්න සම්බන්ධීකරණ කමිටුවට ගියාම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ප්‍රගතිය සම්බන්ධයෙන් කාරණාවක් තියෙනවා මට දැන ගන්න. අපි සභාවක් විදියට අවුරුද්දක් ගෙවී යන මේ මොහොතේ ඒ කාලය තුල ඇත්තටම අපි කීප වතාවක්ම සාකච්ඡා කරලා තීන්දුවක් ගත්තා සභාව සතු ජේ.සී.බී යන්ත්‍රය අලුත්වැඩියා කරන්න. ඉතින් ඊට අවශ්‍ය මූලික ගෙවීම් කටයුතුත් ඒ ආයතනයට සිදු කරා. ඒ ජේ.සී.බි යන්ත්‍රය මීට මාස දෙකකට පමණ පෙර ගෙනැල්ලා තියෙනවා. දැන් ඒ ජේ.සී.බී යන්ත්‍රයේ එංජිම පවා ගලවලා යවලා තියෙනවා නැවත අලුත්වැඩියාව සඳහා. හේතුව ගැන අපි ඒ තරම් විමසන්නේ නෑ. ජේ.සී.බී යන්ත්‍රය යථා තත්වයට පත් කරලා නැවත ක්‍රියාශීලිව කටයුතු කරන්න ක්‍රමවේදයක් සකස් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

වීථි පහන් කට්ටල තුන්සියයක් පමණ ඇණවුම් කරා කියලා ප්‍රගතියේ සඳහන් වෙනවා. එම වීදි පහන් කට්ටල ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් කොට්ඨසවල සවි කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභා ගර්භයට පැමිණීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන යටතේ ලබා ගන්න ඒවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** පොදුවේ ගනිපු ටිකක් නැද්ද ?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- නෑ. මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන යටතේ ගත්තේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** පොදුවේ ටිකක් ගන්න කතා කරා නේද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- නෑ. වෙනත් යෝජනාවක් ආවනේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන යටතේ ගන්න කියලා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එතකොට ඒක මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන වලින් අඩුවෙනවද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔව්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඊගාවට ගරු සභාපතිතුමනි, කිතුලම්පිටිය උදාර පෙදෙස මාර්ගයේ මැනුම් කටයුත්තක් ඉල්ලලා තිබුණා සභාවෙන්. ඒ පිළිබඳව ටිකක් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක කරලා දෙන්නම්. ප්‍රගති වාර්තාව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>II. ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කිරීම.</u>**

**<u>1. පොදු ගෙවීම්</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 01. නරාවල ප්‍රදේශයේ කසල බැහැරලීමේ කටයුතු සඳහා ජේ.සී.බී යන්ත්‍රය කුලී පදනම මත ලබා ගැනිම වෙනුවෙන් ගෙවීම් කටයුතු සිදු කිරීම. යූ.එල්. ජීවන් නදීශාන් රු.127,140.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- එම ගෙවීම මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ගෙවීම ඒකමතිකව සභා සම්මත විය.

02. අප ප්‍රාදේශීය සභාවේ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන දෙක සඳහා ආයුර්වේද ඖෂධ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කටයුතු සිදු කිරීම. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව රු.200,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- එම ගෙවීම මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ගෙවීම ඒකමතිකව සභා සම්මත විය.

**<u>2. කර්මාන්ත ගෙවීම්</u> ඃ-** නැත

**<u>3. සේවක ණය ගෙවීම්</u> ඃ-** නැත

**<u>II. ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කිරීම.</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 01. මැටිලියන්ගේ වත්ත අතුරු පාරේ කොටසක් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම රු.200,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

02. පොළ භූමියේ විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම රු.95,000.00

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>IV. මිල ගණන් කැඳවීම.</u> ඃ-** නැත

**<u>V. ලිපි ඉදිරිපත් කිරීම.</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 01. 252 - 6551 අංක දරණ කැබ් රථයේ අලුත්වැඩියාව (එල්.එච්. අනිල් රංජන් මයා, ලේකම්, බෝ.පෝ.ප්‍රා.ස)

එම ලිපිය අනුව 252 - 6551 අංක දරණ කැබ් රථයේ අලුත්වැඩියාව සඳහා රු. 38,244.00 ක අවම මිල ගණන් ඉදිරිපත් වෙලා තියෙනවා ඉලේපෙරුම මෝටර්ස් ආයතනයෙන්. ඊට අදාළ අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. ගාල්ල, මාම්පිටියේ පිහිටි එස්.ඕ.එස් ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල පිළිබඳ වාර්තාව (ගයන්ත ද සිල්වා මයා, ප්‍රජා සංවර්ධන නිලධාරී, බෝ.පෝ.ප්‍රා.ස)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ වාර්තාව අනුව එම පෙර පාසලේ වර්තමාන තත්වය ගැන තමයි සඳහන් වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එස්.ඕ.එස් ගම්මානයේ අධ්‍යක්ෂකතුමාව කැඳවලා මේ සම්බන්ධව තව ගොඩක් දේවල් කතා කරන්න තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ගැන අපි කමිටුවකදී සාකච්ඡා කරනවද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක අපි ප්‍රජා සංවර්ධන කමිටුවේදී අපි තීන්දුවක් ගනිමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ පෙර පාසල පවරාගන්න අපි සභා තීන්දුවක් ගත්තනේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව අනුව ඉදිරියේදී එස්.ඕ.එස් ආයතනය සම්බන්ධකරගෙන නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව රැස්වී එස්.ඕ.එස් පෙර පාසල සභාවට පවරා ගැනීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා ඃ-** නැත

මීළග මහා සභා රැස්වීම 2019.05.21 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදි.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.